# බළන්ගොඩ නගර සභාව

## 2021-10-18 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.10.18**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ජී.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ජී. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

## 01. පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2021-09-27 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා විසින් 2021-09-27 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රීනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021-09-27 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන

අද දින විශේෂ නිවේදන කිසිවක් නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදී.

## 03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම

- ශ්‍රී ලංකා ස්වයං රැකියා නියුක්තිකයන්ගේ සම්මේලනය මඟින් වෙළඳ කුටි ලබා දීම සම්බන්ධව ලිපියක් මඟින් අවසර ලබා දී ඇති බවත්, එම කුටිය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා බළන්ගොඩ, රාස්සගල ලිපිනයේ පදිංචි ආර්. පී. ඒ. පී. වීරකෝන් මහතා විසින් ඉදිරිපත් කළ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, බස්නැවතුම්පළ පාලම යට කොටසක් පැන්තාලියකට වෙන් කර ගෙන ඇති අතර, ඒ සඳහා සුදුසුම ස්ථානය එය වන බැවින් එම ස්ථානය ලබා දීමට නොහැකි බව ද මෙම කර්තව්‍ය පිළිබඳ විරුද්ධත්වයක් නොමැති අතර වෙනත් විකල්ප ස්ථානයක් ලබා දීම සම්බන්ධව විරුද්ධත්වයක් නොමැති බව ද කිතුල් පැණි, කිතුල් හකුරු හා එළ කිරි වැනි නිෂ්පාදනයන් ස්වයං රැකියාවක් වශයෙන් කරන අයෙකුට බස්නැවතුම්පළේ පාළම අසල ලබා දීමට අදහසක් තමාගේ තිබෙන බව ද ඉහත නම් සඳහන් පුද්ගලයා කරනු ලබන ව්‍යාපාරය කුමක්දැයි නොදන්නා බව ද පවසන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පැවසුවේ බස්නැවතුම්පළ පාලම යට පදික වෙළඳාම් කළ තිදෙනෙක් සිටි අතර, ඔවුන් එම ස්ථානයෙන් ඉවත් කර ලැයිස්තුගත කර ඇති බැවින් මෙම ස්ථානය කුටියකට ලබා දීමෙන් ගැටලුවක් ඇති වන බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම රජය 2022 වර්ෂයේ දී ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර, ඒ හරහා තවත් පුද්ගලයන්ට මේ ආකාරයට ස්ථානයන් ලබා දීමට සිදු වුවහොත් ගැටලුවක් ඇති වන බැවින් දේශපාලනමය වශයෙන් නොව සාධාරණව සිතා තීරණයක් ගත යුතු බව ද පවසන ලදී.

මේ සම්බන්ධව අදහස් දක් වූ ගරු උප සභාපතිතුමා පැවසුවේ නගර සභාව සතු ස්ථානයක් නොමැති බැවින් නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර, ඉඩමක් ලැබුණහොත් තීරණයක් ගැනීම සුදුසු බවයි.

ඒ අනුව ඉදිරියේ දී මේ පිළිබඳව සාකච්ඡා කර, පොදු තීරණයක් ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**පෙ.ව 10.34 ට පමණ ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය සභාවට පැමිණෙන ලදී.**

- 2019 -2021 වර්ෂයන් දක්වා සභාව තුළ අයවැය සම්මත කර ගැනීමට නොහැකිව පරාජය වීම නිසා ජනතාව බලාපොරොත්තු වූ සංවර්ධන කටයුතු සිදු කිරීමට නොහැකි වූ බවත්, ගරු සභාව තුළ බහුතර බලයක් නොමැති ගරු සභාපතිතුමා හට 2022 වර්ෂය සඳහා අයවැය යෝජනා ලබා දීමෙන් කිසිදු ප්‍රතිඵලයක් නොමැති බවත් පවසමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කළ ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක් වූ ගරු සභාපතිතුමා, මෙය දේශපාලන බල පොරය නිසා ඇති වූවක් බව ද 2019-2021 වර්ෂයන්හි අය වැය පරාජය වීමට කිසිදු හේතුවක් නොමැති බව ද ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන අතරින් හොඳම ගිණුම් වාර්තාව පවතින පළාත් පාලන ආයතනය වශයෙන් බළන්ගොඩ නගර සභාව අඛණ්ඩව සම්මාන ලබා ගත් බව ද මේ නිසා කිසිදු හොරකමක් හෝ වංචා දූෂණයක් සිදුව නොමැති බව ද බලය පෙරළීමේ පටු අරමුණ පෙරදැරි කරගෙන අය වැය සම්මත නොකිරීමට කටයුතු කර ඇති බව ද පාර්ලිමේන්තු පනතකින් සම්මත කර බලය ලබා දී ඇති අතර, එම බලය සහිතව සකස් කරන ලද අයවැය ලේඛනය සභාවට ඉදිරිපත් කර ඇති බව ද ඒ අනුව සභාවේ කටයුතු සිදු කරගෙන යන බව ද පවසන ලදී.

එමෙන්ම මෙම දේශපාලන බල පොරය රට තුළ ද පවතින අතර, තමන්ගේ බලය හදා ගන්න, ආරක්ෂා කරගන්න හා බලය වැඩි කර ගන්න උත්සාහ කරනු මිස ජනතාවට සේවයක් කිරීමට කටයුතු නොකරන බව ද මේ නිසා ජනතාව කබලෙන් ලිපට වැටී අළු වී ගොස් ඇති බව ද එවැනි තත්ත්වයක් බළන්ගොඩ ජනතාවට ද ඇති වී ඇති අතර, බල පොරය දිගින් දිගටම පැවතුණහොත් බළන්ගොඩ බදු ගෙවන ජනතාව ද කබලෙන් ලිපට වැටෙන බව පැවසූ ගරු සභාපතිතුමා, ඔබතුමන්ලාගේ මතය මෙය නම් මෙම සභාවේ කාලය අවසන් වන තුරු රැඳී සිටීමට අවශ්‍ය නීතිමය කටයුතු තමන් සිදු කරන බව ද

ගරු මන්ත්‍රීවරුන් කොතරම් බාධා ඇති කළත් හැකි අයුරින් බළන්ගොඩ ජනතාවට සේවය කරන බව ද අභියෝගවලට තමන් කැමති අතර මේ තාක් පැමිණි සියලුම අභියෝග ජයග්‍රහණය කළ බව ද සභාවේ අභියෝගයන් ද හොඳින් කළමනාකරණය කර ජයග්‍රහණය කරමින් ඉදිරියට ගෙන යන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**පෙ.ව 10.39 ට පමණ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- අඩු ආදායම්ලාභී පවුලක දරුවෙකු වන ආර්. එම්. යතුසා ජයනි විජේරත්න දරුවා සඳහා මාර්ගගත අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ස්මාට් දුරකතනයක් ලබා දීම සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස් (රත්නපුර) විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

එම ලිපිය මගින්, ගරු ආණ්ඩුකාරතුමාගේ විශේෂ නියෝගයකින් සභාවේ අත්‍යවශ්‍ය කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය පුනරාවර්තන වියදම් දැරීමට පමණක් අනුමැතිය ලැබී ඇති බැවින් ද මෙම සහනාධාර ලබා දීම එම අනුමැතිය යටතට නොවැටෙන බැවින් ද සහනාධාර ලබා දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලෙස ද අනුමැතියට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන සඳහන් කර ඇති බව ද පැවසූ ගරු සභාපතිතුමා, පළාත් පාලන ආයතනවලට පැවරී ඇති වගකීම්වලට සාපේක්ෂව සහා අරමුදල අධ්‍යාපන කටයුතු සඳහා දුරකතන පහසුකම් ලබා දීම වැනි මහජන සහනාධාර ලබා දීම සම්බන්ධයෙන් නැවත සලකා බලන ලෙස උපදෙස් ලබා දී ඇති බව ද පවසන ලදී.

**පෙ.ව 10.43 ට පමණ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

බළන්ගොඩ ක්‍රීඩා උපදේශකවරුන් සමග බළන්ගොඩ නගර සභා ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල සාකච්ඡාවෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**පෙ.ව 11.37 ට පමණ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- බළන්ගොඩ, ඕලුගංතොට, පුරණ ගෙදර පාර, අංක 59 ඒ ලිපිනයේ පදිංචි ඉන්ද්‍රා පත්මිණි යන අය විසින් තම ඉඩමෙහි යටි පැත්තෙන් මළ දොළ ආර නැමැති ඇළ බසින බවද යාබද ඉඩමේ පදිංචි වී සිටින එස්. වයි. ඉන්දික චමිල් යන අය ඇළෙහි දෙපස වෙනස් කරමින් පැති බැම්මක් ඉදි කරමින් පවතින බව ද මේ නිසා වර්ෂා කාලයේ දී ජලය අවහිර වුවහොත් ඇළ කණ්ඩිය කඩාගෙන යන බවද පවසා තමාගේ ඉඩම ආරක්ෂා වන පරිදි ජලය ගලා යාමට ඉඩ සැලසෙන ආකාරයට සුදුසු පියවරක් ගන්නා ලෙස පවසමින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහිදී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා, එස්. වයි. ඉන්දික චමිල් යන අය විසින් අනවසරයෙන් බලු කුඩුවක් සකස් කර ඇති නිසා විශාල ගැටලු රාශියක් පැන නැගී ඇති බව ද විශේෂයෙන් නිවසේ සියලුම අපද්‍රව්‍ය මෙම ඇළ මාර්ගයට හරවා ඇති අතර, අසූචි මිශ්‍රව පවතින නිසා ඇළ භාවිත කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බව ගොවි මහතුන් තමාට පැවසූ බව ද හැකි ඉක්මනින් බලු කුඩුව ඉවත් කර දෙන ලෙස ද වැඩ අධිකාරීතුමා මේ පිළිබඳ පරීක්ෂා කළ බව ද පැවසීය.

මෙම සම්බන්ධව වැඩ අධිකාරීතුමාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්. ටී. එම් රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව මේ සම්බන්ධව හැකි ඉක්මනින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ගරු සභාපතිතුමා විසින් වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

- බළන්ගොඩ නගරයේ නාගරික සංවර්ධන අධිකාරිය සතු වාණිජ සංකීර්ණ ගොඩනැගිල්ලට අනතුරුදායකව ඇති ගස්වල අතු කපා ඉවත් කර ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා නාගරික සංවර්ධන අධිකාරිය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් සභාගත කරන ලදී.

ඒ අනුව වැඩ අධිකාරීතුමා හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ අධීක්ෂණය යටතේ ගස්වල අතු කපා ඉවත් කිරීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමන් පැවසීය.

මෙම අවස්ථාවේ දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා පොදු වැසිකිළි ටෙන්ඩර්කරු විසින් තැන්පත් මුදල් ආපසු ලබා දෙන ලෙස ලියුමක් ලබා දී ඇති නමුත් එය සභාවේ ඉදිරිපත් නොවූ බව ද තැන්පත් මුදල් ආපසු ලබා දෙන ලෙස කරන ලද එම ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කරන බව ද පවසන ලදී.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ සභා අනුමැතියක් ඒ සඳහා අවශ්‍ය නොවන අතර, අය කර ගැනීමට ඇති මුදල් අයකරගෙන ගෙවීමට හැකි බවයි.

## 04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම

අද දින ටෙන්ඩර්පත් හා මිළ ගණන් නොපවතින බව ගරු සභාපතිතුමා පවසන ලදී.

## 05. කල් දී ඇති ප්‍රශ්න

### 05:01 ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය

05:01:01 ඔරලෝසු කණුව ඉදිරිපිට සැදීමට නියමිත බළන්ගොඩ මානවයා පිළිබඳ සංවර්ධන කටයුතු කෙසේද?

ගරු සභාපතිතුමා මෙහි සංවර්ධන කටයුතු වෙළඳ සංගමය වෙත ලබා දී ඇති බව පැවසීය.

මේ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පිළිතුරු ලබා දෙමින් වෙළඳ සංගමය වශයෙන් අල්විස් ඇඩ්වටයිසින් ආයතනය සමඟ එක්ව මුල්ගල තැබූ නමුත් කොරෝනා වසංගතය හේතුවෙන් මෙහි කටයුතු කල් ගිය බව ද පසුගිය 07 වෙනිදා මෙම ආයතනය පැමිණ රුපියල් ලක්ෂ 09 ක් පමණ වන නව ඇස්තමේන්තුව රැගෙන ගිය බවද ඉදිරියේ දී මෙහි කටයුතු ආරම්භ වන බව ද පවසන ලදී.

මීට අමතරව ඇවිදින මංතීරු ව්‍යාපෘතිය පවතින ස්ථානයේ පස් ඉවත් කර දීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තූතිවන්ත වන බව ද ලංකා බැංකු මාවත ස්ථානයේ අලුතින් කණු කිහිපයක් පවතින බව ද බස්නැවතුම්පළ සිට මහජන පොළ දක්වා විකල්ප මාර්ගයක් සැදීමේ දී මෙම කණු බාධාවක් වන නිසා තමන් ඒ අයව දැනුවත් කළ බව ද ව්‍යාපෘතිය සඳහා ගෙන ආ පස්වලින් ඉතුරු වූ පස් ප්‍රමාණයක් පවතින අතර, බැකෝ යන්ත්‍රය සහ ටිපර් යන්ත්‍රය පැය කීපයකට ලබා දෙන්නේ නම් එම පස් ප්‍රමාණය ඉවත් කර ගැනීමට හැකි බවද පෞද්ගලික බස් කොමර්ෂල් බැංකුව අසල මාර්ගයේ දෙපැත්තෙහිම පවතින බැවින් එම බස් රථ විකල්ප මාර්ගය සකස් කරන අවස්ථාවේ සුද්ධ කළ ඉඩමෙහි නැවැත්වීමට සැලැස්විය හැකි බව ද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසීය.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසූවේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් වාණිජ කටයුතු සඳහා වෙන් කළ ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සිදු කරන තෙක් බස් රථ නවතා තැබීමට ලබා දෙන ලෙස ඉල්ලීමක් කළ හැකි බවයි.

**05:02 ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

05:02:01 බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ පිහිටි දොරවෙල හුණුකුඹුර පාර සහ බෝක්කුව සුද්ධ පවිත්‍ර කිරීමේ වැඩපිළිවෙලෙහි වර්තමාන තත්ත්වය කෙසේද?

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පැවසූවේ පීරිස් මහතාගේ නඩු තීන්දුවේ පිටපතක් ලබා දෙන ලෙස ග්‍රාම සංවර්ධන සමිතිය දැනුවත් කළ ද එය තවමත් ලැබී නොමැති අතර, තීන්දුව අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට සමිතිය සමඟ සාකච්ඡා කළ යුතුව ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් අඩි 03 පාර සහ බෝක්කුව නඩු තීන්දුවකින් ලබා දීමෙන් අනතුරුව සුද්ධ පවිත්‍ර කළ නමුත් මොහු බලහත්කාරයෙන් කටයුතු කරන බවත්, ග්‍රාම සංවර්ධන සමිතිය ජනාධිපතිතුමා දක්වා ලිපි ලේඛන යවා ඇති අතර, සභාව විසින් ගනු ලබන තීන්දු තීරණ පිළිබඳව තමන්ගෙන් විමසන බවත් මොහුගේ සම්පූර්ණ ඉඩමට බෙදුම් නඩුවක් තිබුණ ද ඉඩමේ නමක් වැරදීමක් නිසා නඩුව ඉවත් කර ඇති නමුත් අඩි 03 පාර සහ බෝක්කුව ගැන දීපු තීන්දුව බලාත්මක බවත් පවසන ලදී. එමෙන්ම බෝක්කුව පිරිසිදු නොකිරීම නිසා කුඹුරු ඉඩම් වගා කළ නොහැකි තත්ත්වයකට පත්ව ඇති අතර, ගොවි ජන සේවා නිළධාරීන් මේ පිළිබඳව විමසූ බව ද 2007 වර්ෂයේ නඩු තීන්දුව ලබා දී අවුරුදු ගණනාවක් ගොස් ඇති අතර, සභාව මඟින් කළ යුතු කරුණු කාරණා කර දෙන ලෙසත් වැඩිදුරටත් පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පැවසූවේ 2005 වර්ෂයට පෙර ප්‍රදේශීය සභාවෙන් නඩු පැවරුව ද 2005 න් පසුව නගර සභාවට මෙය අයත් වූ පසු ගම් සිතියම පරීක්ෂා කර මහේස්ත්‍රාත්තුමා තමන් සමඟ මෙම ස්ථානයට ගොස් අවශ්‍ය කටයුතු සිදු කළ නමුත් මහේස්ත්‍රාත්තුමාගේ ස්ථාන මාරු වීමත් සමඟ පැමිණි නව මහේස්ත්‍රාත්වරයා මෙම

ස්ථානය සුද්ධ පවිත්‍ර කර මිනිස්සුන්ට ගමන් කළ හැකි පරිදි සකස් කරන ලෙස පවසා ඇති බවයි.

මේ සම්බන්ධව වැඩ අධිකාරිතුමාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ජී.ජේ. ප්‍රේමකුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා වැඩ අධිකාරීතුමාට පැවසුවේ ග්‍රාම සංවර්ධන සමිතිය, නීතිඥතුමා සහ ලේකම්තුමිය සම්බන්ධ කර ගනිමින් මේ සම්බන්ධව කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසයි.

## 06. කල් දී ඇති යෝජනා

### 06:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා

06:01:01 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| **ද්‍රව්‍ය** | **ප්‍රමාණය** | **දැනට ගබඩාවේ ඇති ප්‍රමාණය** |
|---|---|---|
| දින පොත් (2022 වර්ෂය වෙනුවෙන් නිළධාරීන්ට ලබා දීම සඳහා) | 125 | |
| මේස කැලැන්ඩර් (2022 වර්ෂය සඳහා) | 125 | |
| රෙඩ් ටේප් | 05 | |
| **වාහන සඳහා** | | |
| 600 x 16 ටයර් | 06 | 02 |
| 11 x 28 ටයර් | 02 | 01 |
| 13.6 x 28 ටයර් | 04 | |
| 13.6 x 28 ටියුබ් | 06 | |
| 11 x 28 ටියුබ් | 06 | |
| 600 x 16 ටියුබ් | 06 | |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ02 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

i. RD 8240 අංක දරණ ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු.20,210.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම
ii. ඡායා පිටපත් යන්ත්‍රයේ සේවා ගිවිසුම (2021-08-01 සිට 2022-07-31 දක්වා) සඳහා Metropolitan Technologies (pvt) Limited ආයතනය වෙත රු.18,900.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම
iii. RC 1118 අංක දරණ ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු.25,520.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:03 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2021-09-01 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-09-01 සිට 2021-09-15 දක්වා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම | 01 | 066850 | 315,024.24 |
| 2021-09-09 | දෛනික වැටුප් (සුසාන භූමි, සම්පත් පියස, කර්මාන්ත, කෝම්පෝස්ට්,) | 02-28, 02-30,04, 05,06, 08 | 066851 | 200,419.20 |
| 2021-09-09 | දෛනික වැටුප් (සම්පත් පියස) | 02-30 | 066804 | 26,763.40 |
| 2021-09-16 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-09-16 සිට 2021-09-30 දක්වා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම | 17 | 066877 | 313,623.00 |
| 2021-09-16 | ලංකා විදුලි බල මණ්ඩලය | 30 | 066881 | 28,732.30 |
| 2021-09-16 | ලංකා විදුලි බල මණ්ඩලය (බස් නැවතුම්පළ) | 35 | 066882 | 26,698.00 |
| 2021-09-24 | වැටුප් අත්තිකාරම් (කර්මාන්ත) | 36 | 066914 | 32,000.00 |
| 2021-09-27 | සී/ස ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය - ඉන්ධන බිල්පත් පියවීම (2021-08-13 -2021-8-20, 2021-08-23-2021-08-26 දක්වා) | 38,39, 40 | 066915 | 126,571.90 |
| 2021-09-27 | බී.කේ.ජේ.එස් අමරදාස - ඉන්ධන බිල්පත් පියවීම (2021-08-02 -2021-8-29 | 41 | 066916 | 159,160.91 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 2021 නොවැම්බර් මස සභාවේ ගරු සභිකරුන්ගේ දීමනාව ලෙස රු.270,000.00 ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:05 2021-10-18 දින සිට නොවැම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සෞඛ්‍ය සේවා සඳහා වියදම් ඇස්තමේන්තුව වන රු. 52,390.00 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 2021 නොවැම්බර් මස සභාවේ නිළධාරීන්ගේ අතිකාල හා ගමන් වියදම් ඇස්තමේන්තුව සඳහා රු300,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 2021-10-18 දින සිට නොවැම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ සංග්‍රහ වියදම් ලෙස රු.50,000.00 ක මුදලක් වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ08 2021-10-18 දින සිට 2021 නොවැම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ වාහනවල හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා රු.300,000.00 මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 2021-10-18 දින සිට 2021 නොවැම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ යන්ත්‍ර සූත්‍රවල හදිසි අලුත්වැඩියා කටයුතු සඳහා රු.75,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 2021 නොවැම්බර් මස ගෙවිය යුතු දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය වාරිකය ලෙස රු.769,680.36 මුදලක් ද, වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය වාරිකය ලෙස රු.202,918.84 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 2021 ඔක්තෝම්බර් මාසය සඳහා කාර්යසාධන ණය රු. 800,000.00 කට යටත්ව ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 නිරෝධායන ඇඳිරිනීතිය පැනවූ අගෝස්තු 21 සිට සැප්තැම්බර් 30 දක්වා පහත ක්ෂේත්‍රයන්ට අදාලව ගාස්තු අඩු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

i. කඩ කුලී අය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධ අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, නිරෝධායන ඇඳිරිනීතිය ක්‍රියාත්මක වූ කාල සීමාව තුළ කඩ කුලී අය කිරීම 100% ක් නිදහස් කිරීම සුදුසු බව පවසන ලදී.

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා විසින් නිරෝධායන ඇඳිරිනීතිය පැනවූ අගෝස්තු 21 සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ කඩ කුලී අය කිරීම 100% ක් නිදහස් කිරීම සුදුසු බවට යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ii. තානායම් කුලිය අය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා තානායම් පවත්වාගෙන යාම සම්බන්ධව සෞඛ්‍ය මාර්ගෝපදේශ ඔක්තෝම්බර් මස අවසන් වනතුරුම පවතින බැවින් නිරෝධායන ඇඳිරිනීතිය පැනවූ අගෝස්තු 21 සිට ඔක්තෝම්බර් 31 දක්වා කාලය තුළ තානායම් කුලී අය කිරීම 100% ක් නිදහස් කිරීමත් ඉන් ඉදිරියට ගනු ලබන තීරණ මීළඟ සභාවාරයේ දී ගැනීමත් සුදුසු බවට යෝජනා කළ අතර, ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

iii. නිරෝධායන ඇඳිරිනීතිය පැනවූ අගෝස්තු 21 සිට සැප්තැම්බර් 30 දක්වා හා ඔක්තෝම්බර් මස කඩ කුලිය සම්බන්ධයෙන් වන ප්‍රමාද ගාස්තු අය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අනතුරුව නිරෝධායන ඇඳිරිනීතිය පැනවූ අගෝස්තු 21 සිට සැප්තැම්බර් 30 දක්වා හා ඔක්තෝම්බර් මස කඩ කුලිය සම්බන්ධයෙන් වන ප්‍රමාද ගාස්තු අය නොකිරීම සුදුසු බව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ13 2022 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවේ පහත සඳහන් බදු හා ගාස්තු පැනවීම වෙනුවෙන් ගැසට් නිවේදන පළ කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

***<u>2022 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම</u>***

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ නගර සභා සීමාව ඇතුළත පිහිටියාවූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2012 වර්ෂයේදී සිදුකරන ලද තක්සේරුව/ සත්‍යාක්ෂණය 2022 වර්ෂය සඳහා පාදකකර ගැනීමටත්, එකී තක්සේරුව මත ඉහත කී නගර සභා ආඥා පනතේ 160 වන වගන්තිය ප්‍රකාරව සභාව වෙත පැවරී ඇති බලතල යටතේ බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ ඇතුළත පිහිටියාවූ කිසියම් දේපළක් මත ඉහත කී තක්සේරුව සඳහා නියමකර ඇති වාර්ෂික වටිනාකමින්,

(අ). නේවාසික ස්ථාන සඳහා සියයට හතර (4%)ක වාර්ෂික වරිපනම් බදු අනුප්‍රමාණයමද,

(ආ). වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන දේපළයන් මත සියයට පහ (5%)ක වරිපනම් බදු අනුප්‍රමාණයමද,

නියමවිය යුතු බවටත්,

තවද, 2022 වර්ෂයේ පහත උප ලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඊට ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස සමස්ත වාර්ෂික වරිපනම් බද්ද 2022 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහය(10%)ක වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් සියයට පහ(5%)ක වට්ටමක්ද නගර සභාව විසින් ලබාදිය යුතු වේ.

***ඉහත කී උපලේඛනය***

| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම් ලබන අවසාන දිනය |
|---|---|---|
| 2022 වර්ෂයේ පළමුවන කාර්තුව | 2022-03-31 | 2022-01-31 |
| 2022 වර්ෂයේ දෙවන කාර්තුව | 2022-06-30 | 2022-04-30 |
| 2022 වර්ෂයේ තුන්වන කාර්තුව | 2022-09-30 | 2022-07-31 |
| 2022 වර්ෂයේ හතරවන කාර්තුව | 2022-12-31 | 2022-10-31 |

***<u>2022 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම</u>***

255 වැනි අධිකාරිය වන 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 165 අ(1)(2) වගන්තිවලින් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර බලංගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ 11 වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කල යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2022 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර නගර සභා කාර්යාලයට ගෙවිය යුතු වේ.

| I වන තීරුව | | II වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ ස්වභාවය | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750/= නොයික්මවන අවස්ථාවක | රු. 750/= ඉක්මවන එහෙත් රු. 1,500/= නොයික්මවන අවස්ථාවක | රු. 1,500/= ඉක්මවන අවස්ථාවක |
| 01 | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 02 | ස්වර්ණාභරණ නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 03 | මැටි භාණ්ඩ නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 04 | දුරකථන/ ඡායාපිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 05 | මැණික් කැපීම හා ඔප දැමීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 06 | මිනී පෙට්ටි නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 07 | වඩු කර්මාන්තශාලා | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 08 | තේ කර්මාන්තශාලා | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 09 | ගමන් මළු නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 10 | පාවහන් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 11 | ගීත/ වීඩියෝ පටිගත කිරීම හෝ තැටිගත කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 12 | පින්තූර රාමු කිරීමේ වැඩපල | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 13 | වාහන බ්‍රේක් ලයිනර්/ ක්ලච් ප්ලේට් නිපදවීමේ වැඩපල | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 14 | ඇඟලුම් කර්මාන්තශාලා | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 15 | පොහොර නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 16 | සිසිල්බීම නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 17 | යෝගට් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 18 | රසකැවිලි නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 19 | ගම් වර්ග නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 20 | විෂබීජ නාශක ද්‍රව්‍ය නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 21 | ඉටිපන්දම් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 22 | හඳුන්කූරු නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 23 | තීන්ත හෝ වාර්නිෂ් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 24 | බිම ඔපදමන පොලිෂ් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 25 | කොහු නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 26 | කොසු/ ඉදල්, පිරිසිදු කිරීමේ උපකරණ නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 27 | වේවැල් භාණ්ඩ නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 28 | දුම්කොළ නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 29 | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 30 | ඩිජිටල් ප්‍රින්ටින් | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 31 | ඡායා පිටපත් ගැනීමේ ස්ථාන | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 32 | ඇඳුම් මැසීමේ ස්ථාන (ටේලර් ෂොප්) | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 33 | ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථාන | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 34 | ඉලෙක්ට්‍රොනික් උපකරණ අලුත්වැඩියා කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 35 | නගර සහ උද්‍යාන අලංකරන සැළසුම් සකස්කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |

***2022 වර්ෂය සඳහා ව්‍යාපාරික බද්ද පැනවීම.***

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 165 (ආ) වගන්තියෙන් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාර, එකී ආඥා පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවක විධිවිධාන යටතේ බලපත්‍රයක් ලබා ගැනීම හෝ එකී ආඥාපනතේ 165 අ වැනි වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීම අවශ්‍ය

නොවන්නා වූ හා වෘත්තියක් නොවන්නා වූ කිසියම් ව්‍යාපාරයක් බලංගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2022 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එහි 11 වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2022 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2022 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර බලංගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු වේ.

**උපලේඛනය**

| **I වන තීරුව** | **II වන තීරුව** | |
|---|---|---|
| බද්ද අදාල වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | ගෙවිය යුතු බද්ද | |
| | රුපියල් | ශත |
| රුපියල් 6,000.00 නොඉක්මවන අවස්ථාවක | - | |
| රුපියල් 6,000.00 ඉක්මවන එහෙත් රුපියල් 12,000.00 නොඉක්මවන අවස්ථාවක | 90 | 00 |
| රුපියල් 12,000.00 ඉක්මවන එහෙත් රුපියල් 18,750.00 නොඉක්මවන අවස්ථාවක | 180 | 00 |
| රුපියල් 18,750.00 ඉක්මවන එහෙත් රුපියල් 75,000.00 නොඉක්මවන අවස්ථාවක | 360 | 00 |
| රුපියල් 75,000.00 ඉක්මවන එහෙත් රුපියල් 150,000.00 නොඉක්මවන අවස්ථාවක | 1,200 | 00 |
| රුපියල් 150,000.00 ඉක්මවන අවස්ථාවක | 3,000 | 00 |

**දෙවන කොටස**

*ව්‍යාපාරික බද්දට යටත්වන විෂයයන්*

01. ආයුර්වේද බෙහෙත් අලෙවිය
02. ඇස් කණ්ණාඩි අලෙවිකිරීම
03. ඉංග්‍රීසි බෙහෙත් අලෙවිය (ෆාමසි)
04. ඉන්ධන පිරවුම්හල
05. උකස්බඩු ගන්නා ස්ථාන
06. උත්සව භාණ්ඩ කුලී පදනම මත සැපයීම
07. කුළු බඩු එකතුකිරීම හා අලෙවිය
08. කෘෂි උපකරණ අලෙවිය
09. කොමිස් නියෝජිතවරුන්/ වෙන්දේසිකරුවන්
10. ඛනිජ තෙල් හා ලිහිසුම් තෙල් අලෙවිය
11. ගෘහ නිර්මාණ සැළසුම් සකසන ස්ථානයක් පවත්වාගෙන යාම
12. ගෘහ භාණ්ඩ අලෙවිය
13. ගෘහ සේවක සේවිකාවන් සැපයීම

14. ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය
15. ග්‍රොසරියක් පවත්වාගෙන යාම
16. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
17. තරාදි අලෙවිය
18. තේ පිටි සකස් කිරීම හා අලෙවිය
19. තොග වෙළඳාම
20. දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
21. දැව/ ලී අලෙවිය
22. දුම්පරීක්ෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
23. දුරකථන අලෙවිය
24. දුරකථන සේවා (කොමිනිකේෂන්)
25. දේශීය වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම /ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
26. නිමි ඇඳුම් අලෙවිය
27. නොතාරිස්/ නීතිඥ කාර්යාලයක් පවත්වාගෙන යාම
28. පරිගණක අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
29. පරිසනක/ පරිසනක උපාංග අලෙවිය
30. පාවහන් අලෙවිය
31. පුද්ගලික නියෝජිත තැපැල් කාර්යාල
32. පූජා භාණ්ඩ අලෙවිය
33. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
34. ප්ලාස්ටික් භාණ්ඩ අලෙවිය
35. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (මෙඩිකල් සෙන්ටර්ස්)
36. රටබීම අලෙවිය
37. මල් සහ පැළ වර්ග අලෙවිය
38. මැටි භාණ්ඩ අලෙවිය
39. මිශ්‍ර වෙළඳාම
40. මූල්‍ය ආයතන
41. මෝටර් වාහන අමතර කොටස් අලෙවිය
42. මෝටර් සයිකල් අලෙවිය
43. යන්ත්‍රසූත්‍ර කුලී පදනම මත සැපයීම
44. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
45. රථ වාහන අලෙවිය

46. රථ වාහන කුලී පදනම මත යෙදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම

47. රන් භාණ්ඩ ස්වර්ණාභරණ අලෙවිය

48. රා තැබෑරුමක් පවත්වාගෙන යාම

49. රියදුරු පුහුණු පාසැලක් පවත්වාගෙන යාම

50. රෙදිපිළි වෙළඳාම

51. රේස් ඔට්ටුපොලක් පවත්වාගෙන යාම

52. ලිපිද්‍රව්‍ය පාසැල් උපකරණ අලෙවිය

53. ලේ/ මුත්‍ර පරීක්ෂාව /රසායනාගාර සේවාවන් පවත්වාගෙන යාම

54. ලොතරැයි අලෙවිය

55. විදුලි උපකරණ අලෙවිය

56. විසිතුරු භාණ්ඩ අලෙවිය (ලවර්ස්)

57. වීඩියෝ පටි/ තැටි කුලියට දීම හා අලෙවිය

58. ව්‍යායාම උපකරණ අලෙවිය

59. ශබ්ද විකාශන යන්ත්‍ර කුලී පදනම මත සැපයීම

60. ශරීර සුවතා මධ්‍යස්ථාන

61. සාත්තුසේවා කටයුතු

*__2022 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම.__*

1939 අංක 61 දරණ නගර සභා ආඥා පනත හෙවත් ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරයේ 162 වන වගන්තිය හා 164 වන වගන්තිය ප්‍රකාරව හා 2019-12-05 දිනැති අංක 2152/34 අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කර ඇති බලංගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන අන්තරාදායක,අප්‍රසන්න,අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරවත්, පනතේ 164 වගන්තියේ 1 තීරයේ සඳහන් වාර්ෂික වටිනාකම් මත එහි 11 තීරයේ සඳහන් බලපත්‍ර ගාස්තු 2019-12-05 දිනැති අංක 2152/34 අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කාර්යයන් සඳහා අය කරනු ලැබේ.

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති හෝටලයක්, ආපනශාලාවක්, නවාතැන්පලක් වන විටකදී ඊට අදාළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ පෙර වර්ෂයේ ලැබීම් වලින් 1%(සියයට එක)ක් බලපත්‍ර ගාස්තු ලෙස 2022 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් එම නියමය 2022 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

| I වන තීරය | 11 වන තීරය |
|---|---|
| වාර්ෂික වටිනාකම | රු.ශත |
| රු.750 නොයික්මවන විට | 500.00 |
| රු.750 ඉක්මවන නමුත් රු,1500 නොයික්මවන විට | 750.00 |
| රු.1500 නොයික්මවන විට | 1,000.00 |

***2022 වර්ෂය සඳහා බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තු පැනවීම.***

බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව බලංගොඩ නගර සභා සීමාව ඇතුළත ඇතිකරනු ලබන සෑම බල්ලෙක් හා බැල්ලියක් වෙනුවෙන් 2022 වර්ෂයේදී මෙම සභාවට ගෙවිය යුතු වාර්ෂික බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව හා කරපටි ගාස්තුව ලෙස රුපියල් සියය (100.00) ක් විය යුතු බවට පනවා එම පැනවීම 2022 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

***2022 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම.***

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය වූ නගර සභා ආඥා පනතේ 170(අ) 1,2 වගන්ති හා එහි 157(9) (ආ) ප්‍රකාරවත් 1952 අංක 06 දරණ පළාත් පාලන මණ්ඩල ආදර්ශ උපනීති XXI අනුවත්, 2013-06-28 දිනැති නගර සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා අනුව කසල ගාස්තු අය කල යුතු ආයතන හා ගාස්තු පහත පරිදි වේ.

| ස්වභාවය | වාර්ෂික ගාස්තු රු | කාර්තුවකට අය කල යුතු මුදල |
|---|---|---|
| නවාතැන්පල | 4,080.00 | 1,020.00 |
| හෝටල් | 4,080.00 | 1,020.00 |
| බේකරි | 4,800.00 | 1,200.00 |
| රෙදිකඩ | 4,800.00 | 1,200.00 |
| බත්කඩ,කෝපි කඩ,ආපන ශාලා,තේ කඩ | 2,400.00 | 600.00 |
| භෝජනාගාර | 4,080.00 | 1,020.00 |
| සුපිරි වෙළඳසැල් | 9,600.00 | 2,400.00 |
| සිල්ලර කඩ | 1,800.00 | 450.00 |
| තේ කඩ | 2,400.00 | 600.00 |
| සැලූන්,රූපලාවන්‍යාගාර | 1,200.00 | 300.00 |
| වී මෝල් | 3,600.00 | 900.00 |
| පුද්ගලික පන්ති | 3,000.00 | 750.00 |
| තොග වෙළඳසැල් | 6,000.00 | 1,500.00 |
| හාඩ්වෙයාර් | 1,800.00 | 450.00 |
| සුරාසැල් | 4,800.00 | 1,200.00 |

***2022 වර්ෂය සඳහා ගෝ ඝාතක ආඥා පනත ප්‍රකාරව කොටු ගාස්තු පැනවීම***

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 162(1) අ වන වගන්තිය ප්‍රකාරව සභාව වෙත පැවරී ඇති බලතල අනුව 1893 අංක 09 දරණ ගෝ ඝාතක ආඥා පනතේ 09 වන වගන්තිය ප්‍රකාරවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී

ජනරජයේ ගැසට් පත්‍ර අංක 10939 හා 1956-06-08 ගැසට් නිවේදනයේ අංක XV අනුව මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි කොටු ගාස්තු නියම කර 2022 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

උපලේඛනය

- ගවයෙක් ඝාතනය කිරීමේ කොටු ගාස්තුව රු 200.00
- එළුවෙක් ඝාතනය කිරීමේ කොටු ගාස්තුව රු 100.00
- තාවකාලික සෝ ඝාතක බලපත්‍ර ගාස්තුව රු 500.00
- වාර්ෂික සෝ ඝාතක බලපත්‍ර ගාස්තුව රු 1,000.00

***2022 වර්ෂය සඳහා බලංගොඩ නගර සභාවෙන් සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු පැනවීම.***

**උප ලේඛනය**

| අනු අංකය | සේවාව | කාරණය | 2022 වර්ෂයට ගාස්තුව |
|---|---|---|---|
| 01 | ජල සහතිකයක් ලබා ගැනීම | ▪ අයදුම්පත්‍ර ගාස්තුව<br>▪ සහතික ගාස්තුව | රු. 100.00<br>රු. 200.00 |
| 02 | විදුලි සහතිකයක් ලබා ගැනීම | ▪ අයදුම්පත්‍ර ගාස්තුව<br>▪ සහතික ගාස්තුව | රු. 100.00<br>රු. 200.00 |
| 03 | ගොඩනැගිලි රේඛා සහතිකයක් ලබා ගැනීම | ▪ අයදුම්පත්‍ර ගාස්තුව<br>▪ සහතික ගාස්තුව | රු. 100.00<br>රු. 750.00 |
| 04 | ජල බවුසරය කුලියට සැපයීම | ▪ පානීය ජල බවුසරයක්<br>▪ පානීය නොවන ජල බවුසරයක්<br>▪ ස්ථානයේ නතරකර තැබීම දිනකට<br>▪ මාර්ග සංවර්ධන කටයුතුවල දී ජලය ඉසීම හෝ පාර සේදීම සඳහා එක ජල බවුසරයක් සඳහා (නගර සීමාවෙන් පිටතට ධාවනය වන සෑම 1Km සඳහාම රු.300.00 බැගින් අය කෙරේ.) | රු. 3,000.00<br>රු. 2,750.00<br>රු. 2,000.00<br>රු. 1,000.00 |
| 05 | ක්‍රීඩා පිටිය කුලියට දීම | ▪ ක්‍රීඩා පිටිය පමණක් දිනකට<br>▪ ප්‍රේක්ෂකාගාරය සමඟ දිනකට<br>▪ සැණකෙලි හා සංගීත සංදර්ශන එක් රාත්‍රියක් පැවැත්වීම සඳහා<br>▪ ක්‍රීඩා උත්සව පැවැත්වීම-එක් රාත්‍රියක් සඳහා | රු. 3,000.00<br>රු. 5,000.00<br>රු.25,000.00<br>රු,10,000.00 |
| 06 | ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීම | යන්ත්‍ර පැයක් සඳහා(ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු. 2,600.00 |
| 07 | ලෙලෙන තලනය කුලියට දීම (ටොන් 01)<br>ලෙලෙන තලනය කුලියට දීම(ටොන් 01) | පැය අටක සේවා දින භාගයක් සඳහා(දින 1/2)<br>පැය අටක සේවා දිනක් සඳහා | රු. 3,000.00<br>රු. 4,920.00 |

| | | | |
|---|---|---|---|
| | ලෙලෙන තලනය කුලියට දීම(ටොන් 10) | යන්ත්‍ර පැය එකක් සඳහා (ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු. 3,325.00 |
| 08 | මෝටර් ග්‍රේඩරය කුලියට දීම | යන්ත්‍ර පැය එකක් සඳහා(ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු.2,850.00 |
| 09 | කොඩි කණු කුලියට ලබා දීම | එක කණුවක් එක දිනකට | රු. 50.00 |
| 10 | ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම | අයදුම්පත්‍ර ගාස්තුව | රු. 200.00 |
| 11 | බිම් කට්ටි සැළසුම් අනුමත කිරීම | අයදුම්පත්‍ර ගාස්තුව | රු. 100.00 |
| 12 | ගලි සේවාව සැපයීම<br>ලීටර් 2500 ගලි බවුසරය<br>සඳහා | නගර සීමාවේ නිවාස/ ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු. 5,250.00 |
| | | නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා | රු. 6,250.00 |
| | | නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා | රු. 9,500.00 |
| | | නගර සීමාවෙන් පිටත නිවාස/ ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු.9,000.00 |
| | | නගර සීමාවෙන් පිටතට වැඩි වන සෑම කිලෝමීටර් 1ක් සඳහා | රු. 200.00 |
| | ගලි සේවාව සැපයීම ලීටර් 4000 ගලි බවුසරය සඳහා | නගර සීමාවේ නිවාස/ ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු,7,000.00 |
| | | නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා | රු,8,000.00 |
| | | නගර සීමාවෙන් පිටත නිවාස/ ආගමික ස්ථාන/ පුණ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු,10,750.00 |
| | | නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා | රු,11,250.00 |
| | | නගර සීමාවෙන් පිටතට වැඩිවන සෑම කිලෝමීටර් 1ක් සඳහා | රු.300.00 |
| 13 | සුසාන භූමි ගාස්තු | ▪ මිනියක් මිහිදන් කිරීම<br>▪ සභා සේවකයින් 02ක් සැපයීමේ ගාස්තුව<br>▪ ස්මාරක ඉදිකිරීමේ ගාස්තුව<br>▪ අළු තැන්පත් කිරීම වර්ග අඩි 01ක කුටිය | රු. 1,300.00<br>රු. 3,000.00<br>අවසරනැත<br>රු.15,000.00 |
| 14 | නොපවරා ගැනීමේ සහතිකයක් ලබා ගැනීම | ▪ අයදුම්පත්‍ර ගාස්තුව<br>▪ සහතික ගාස්තුව | රු. 100.00<br>රු. 750.00 |
| 15 | අනතුරුදායක ගස් පරීක්ෂා කිරීම | ▪ පරීක්ෂණ ගාස්තු | රු.500.00 |

| | | | |
|---|---|---|---|
| 16 | වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීම | අයදුම්පත්‍ර ගාස්තුව | රු. 100.00 |
| 17 | තක්සේරු ලේඛනයට නම ඇතුළත් කිරීම | ලියාපදිංචි ගාස්තුව | රු. 600.00 |
| 18 | තක්සේරු ලේඛනයේ පිටපතක් ලබා ගැනීම | පිටපතක් සඳහා ගාස්තු | රු. 100.00 |
| 19 | වරිපනම් උද්‍යත ලබා ගැනීම | එක් වර්ෂයක් සඳහා ගාස්තුව | රු. 100.00 |
| 20 | ප්‍රචාරක දැන්වීම් ,බැනර්,පෝස්ටර්,කටවුට් ප්‍රදර්ශනය කිරීම<br>ප්‍රචාරක දැන්වීම් ,බැනර්,පෝස්ටර්,කටවුට් ප්‍රදර්ශනය කිරීම | වර්ග අඩි 01ක් දින 14ක් ප්‍රදර්ශනය කිරීම<br>වර්ග අඩි 01ක් මාසයක් ප්‍රදර්ශනය කිරීම | රු. 75.00<br>රු,150.00 |
| 21 | දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම-ස්ථිර | වර්ග අඩි 01 ක් වර්ෂයක් සඳහා ප්‍රදර්ශනය කිරීම<br>වර්ග අඩි 01ක් සහා දේපල තුළ වර්ෂයක් ප්‍රදර්ශනය සඳහා බිම් කුලිය | රු. 150.00<br>රු,250.00 |
| 22 | අනවසර ප්‍රචාරක දැන්වීම් සඳහා දඩ ගාස්තු | කටවුට් වර්ග අඩි 01ක් සඳහා<br>පෝස්ටර් වර්ග අඩි 01ක් සඳහා<br>බැනර් වර්ග අඩි 01ක් සඳහා | රු,200.00<br>රු,100.00<br>රු,200.00 |
| 23 | එල්.ඊ.ඩී ප්‍රචාරක දැන්වීම් | වර්ග අඩි 01ක් මාසයක් ප්‍රදර්ශනය කිරීම සඳහා | රු,80.00 |
| 24 | පුස්තකාල ගාස්තු අය කිරීම. | සාමාජික අයදුම් පත්‍ර ගාස්තුව | රු,10.00 |
| | | නගර සීමාව තුළ ළමා සාමාජික ගාස්තු | රු,100.00 |
| | | නගර සීමාව තුළ වැඩිහිටි සාමාජික ගාස්තු | රු,200.00 |
| | | නගර සීමාව තුළ ළමා සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු | රු,50.00 |
| | | නගර සීමාව තුළ වැඩිහිටි සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු | රු,50.00 |
| | | නගර සීමාවෙන් පිට වැඩිහිටි සාමාජික ගාස්තු | රු,300.00 |
| | | නගර සීමාවෙන් පිට ළමා සාමාජික ගාස්තු | රු,150.00 |
| | | නගර සීමාවන් පිට ළමා සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව | රු,100.00 |
| | | නගර සීමාවන් පිට වැඩිහිටි සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව | රු,100.00 |
| | | පාඨක සමාජයටඇතුළත් වීමේ ගාස්තුව | රු,5.00 |
| | | පාඨක සමාජයේ සාමාජික ගාස්තු වසර දෙකක් සඳහා | රු,120.00 |
| | | එක් දිනකට එක් පොතක් සඳහා පොත් ප්‍රමාද ගාස්තුව | රු,2.00 |

| | | | |
|---|---|---|---|
| | | නැතිවූ පොතක් සඳහා පොතේ නියම වටිනාකම සහ දෙපාර්තමේන්තු ගාස්තු ලෙස පොතේ වටිනාකමින් | 25% |
| | | පොත් බැඳීමේ ගාස්තු | රු,200.00 |
| 25 | පා පැදි බලපත්‍රය | ▪ අයදුම්පත්‍ර ගාස්තුව<br>▪ බලපත්‍රය | රු. 100.00<br>රු. 5.00 |
| 26 | අනුමත මිනින්දෝරු සැළැස්ම | ▪ සහතික පිටපතක් නිකුත් කිරීම<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම පමණක් ලබා දී ඇති විට<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා වර්ෂය ලබා දී ඇති විට<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා අංකය ලබා දී ඇති විට | රු. 250.00<br>රු.500.00<br>රු.300.00<br>රු,200.00 |
| 27 | අනුමත ගොඩනැගිලි සැළැස්ම | ▪ කාලය දීර්ඝ කර ගැනීම-එක් වසරක් සඳහා<br>▪ සහතික පිටපතක් නිකුත් කිරීම<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම පමණක් ලබා දී ඇති විට<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා වර්ෂය ලබා දී ඇති විට<br>▪ ලේඛන සෙවීමේ ගාස්තු-නම හා අංකය ලබා දී ඇති විට | රු ,500.00<br>රු. 500.00<br>රු.500.00<br>රු,300.00<br>රු,200.00 |
| 28 | පෙර පාසැල | ▪ ළමුන් ඇතුළත් කිරීමේ ගාස්තුව (එක් වර්ෂයකට) | රු. 2,000.00 |
| 29 | අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් | ▪ එක දිනක් සඳහා බිම් බද්ද<br>▪ වැඩිවන අමතර දිනයක් සඳහා | රු. 3,000.00<br>රු. 1,000.00 |
| 30 | කාබනික පොහොර අළෙවිය | ▪ කිලෝ 50 පොහොර උරයක්<br>▪ කිලෝ 25 පොහොර උරයක්<br>▪ කිලෝ 10 පොහොර උරයක්<br>▪ ගලි පොහොර කිලෝ 01ක් සඳහා (කාබනික පොහොර කිලෝ 01ක මිල රු.10.00 බැගින් කවර රහිතව ලබා දෙයි. මුද්‍රිත කවරයේ ලබා ගන්නේ නම් කවරයේ වටිනාකම අය කරනු ලැබේ. පාවිච්චි කරන ලද කවරයක පොහොර ලබා ගන්නේ නම් එම කවරයේ වටිනාකම අය කරනු ලැබේ.) | රු. 500.00<br>රු. 250.00<br>රු. 100.00<br>රු. 18.00 |
| 31 | මාර්ග පළුදු කිරීම | ▪ කාපට් ඇතිරූ මාර්ග තලය පළුදු කිරීම<br>▪ තාර/ කොන්ක්‍රීට්/ අන්තර් සම්බන්ධිත ගල් අතුරන ලද මාර්ග තලය පළුදු කිරීම වර්ග මීටර් 01ක් සඳහා<br>▪ පස් සහිත මාර්ග උරහිස සහ මාර්ග තලය පළුදු කිරීම වර්ග මීටර් 01ක් සඳහා | අවසර නැත<br>රු520.00<br>රු,155.00 |
| 32 | පොදු වැසිකිළි ගාස්තු | ▪ වැසිකිළි/ කැසිකිළි යාම සඳහා එක් වරකට<br>▪ බස්නැවතුම්පල උඩුමහලේ ඇති වැසිකිළිය බස්නැවතුම්පල බස් රථ රියදුරන් හා කොන්දොස්තර මහතුන් | රු. 10.00<br>රු.5.00 |

| | | | |
|---|---|---|---|
| | | සඳහා වැසිකිළි/ කැසිකිළි යාම සඳහා එක් වරකට | |
| 33 | හිස් තාර බැරල් | ■ එක තහඩුවක් සඳහා | රු. 150.00 |
| 34 | ලේඛනාගාරයෙන් ලිපි/ලේඛන ස්කෑන් කර ලබා ගැනීම. | ■ A-4 කොලයක් සඳහා<br>( A-4 කොල 25කට වඩා ස්කෑන් පිටපත් අවශ්‍ය වන්නේ නම් 1ක් රු,7.00 ක් වේ)<br>■ ලීගල් කොලයක් සඳහා<br>(ලීගල් කොල 25කට වඩා ස්කෑන් පිටපත් අවශ්‍ය වන්නේ නම් 1ක් රු,8.00වේ.)<br>■ A-3 කොලයක් සඳහා<br>■ A-3 කොලවලට වඩා ප්‍රමාණයෙන් විශාල කොළ වර්ග අඩියක් සඳහා | රු,10.00<br>රු,12.00<br>රු,25.00<br>රු,20.00 |
| 35 | බලංගොඩ නව බස්නැවතුම්පොළ කඩ කාමර සඳහා | ■ ජල සම්බන්ධතා ලබා ගැනීමේ ගාස්තුව<br>■ ජල සම්බන්ධතා මාසික ගාස්තුව(මාසික ජල බිල් පත අනුව අය කරනු ලබයි)<br>■ විසන්ධි කළ ජල සම්බන්ධතාවය නැවත ලබා ගැනීම | රු,5,000.00<br>රු,1,000.00 |
| 36 | සනීපාරක්ෂක තුවා /ළමා හා වැඩිහිටි ඩයපර්ස් | ■ කිලෝ එක හෝ එකට අඩු<br>■ කිලෝ එකේ සිට දෙක දක්වා<br>■ කිලෝ දෙකේ සිට තුන දක්වා<br>(නොදිරන කසල එකතු කිරීමේ ට්‍රැක්ටර් රථයට අදාළ මුදල ගෙවා භාරදිය යුතුය) | රු,30.00<br>රු,40.00<br>රු,50.00 |

ඉහත සඳහන් සියලු ගාස්තුවලට අමතරව රජයේ අනුමත බදු වෙනමම එකතු කරනු ලැබේ.

***<u>මස් පිණිස සතුන් මැරීම හෝ මරන ලද සතුන්ගේ මස් ප්‍රදර්ශනය සම්පූර්ණයෙන්ම තහනම් දින නිවේදනය කිරීම - 2022 වර්ෂය -</u>***

පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන දිනයනුත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් පනවනු ලබන දිනයනුත් බළන්ගොඩ නගර සභාව විසින් අවස්ථාවෝචිත පරිදි තීරණය කරනු ලබන දිනයන්හිත් , බළන්ගොඩ නගර සීමාවේ 2022 වර්ෂයේ මස් පිණිස සතුන් මැරීම හෝ මරන ලද සතුන්ගේ මස් විකිණීම හෝ විකිණීම සඳහා මස් ප්‍රදර්ශනය කිරීම, විකිණීම සඳහා මස් ළඟ තබා ගැනීම සම්පූර්ණයෙන් තහනම් කරන ලද අතර, මෙකී නිවේදනය 2022 වර්ෂයේ ජනවාරි මස 01වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**උපලේඛනය**

| වර්ෂය | මාසය | දිනය | කාරණය |
|---|---|---|---|
| 2022 | ජනවාරි | 14-සිකුරාදා | තෛපොංගල් දිනය |
| 2022 | ජනවාරි | 17- සඳුදා | දුරුතු පුර පසළොස්වක |
| 2022 | පෙබරවාරි | 04- සිකුරාදා | ජාතික නිදහස් දිනය |
| 2022 | පෙබරවාරි | 16-බදාදා | නවම් පුර පසළොස්වක |
| 2022 | මාර්තු | 01-අඟහරුවාදා | මහ ශිව රාත්‍රී දිනය |
| 2022 | මාර්තු | 17-බ්‍රහස්පතින්දා | මැදින් පුර පසළොස්වක |
| 2022 | අප්‍රේල් | 15-සිකුරාදා | මහ සිකුරාදා |
| 2022 | අප්‍රේල් | 13-බදාදා | සිංහල දෙමළ අළුත් අවුරුදු දිනට පෙර |
| 2022 | අප්‍රේල් | 14-බ්‍රහස්පතින්දා | සිංහල දෙමළ අළුත් අවුරුදු දිනය |

| | | | |
|---|---|---|---|
| 2022 | අප්‍රේල් | 16-සෙනසුරාදා | බක් පුර පසළොස්වක |
| 2022 | මැයි | 01-ඉරිදා | ලෝක කම්කරු දිනය |
| 2022 | මැයි | 03-අඟහරුවාදා | රාමසාන් උත්සව දිනය |
| 2022 | මැයි | 15-ඉරිදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 2022 | මැයි | 16-සඳුදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 2022 | ජූනි | 14-අඟහරුවාදා | පොසොන් පුර පසළොස්වක |
| 2022 | ජූලි | 10-ඉරිදා | හජ්ජි උත්සව දිනය |
| 2022 | ජූලි | 13-බදාදා | ඇසළ පුර පසළොස්වක |
| 2022 | අගෝස්තු | 11-බ්‍රහස්පතින්දා | නිකිණි පුර පසළොස්වක |
| 2022 | සැප්තැම්බර් | 09-සිකුරාදා | බිනර පුර පසළොස්වක |
| 2022 | ඔක්තොම්බර් | 09-ඉරිදා | (මිලා-දුන්-නබි)නබිනායකතුමාගේ උපන් දිනය |
| 2022 | ඔක්තොම්බර් | 09-ඉරිදා | වප් පුර පසළොස්වක |
| 2022 | ඔක්තොම්බර් | 24-සඳුදා | දීපවාලි උත්සව දිනය |
| 2022 | නොවැම්බර් | 08-අඟහරුවාදා | ඉල් පුර පසළොස්වක |
| 2022 | දෙසැම්බර් | 07-බදාදා | උඳුවප් පුර පසළොස්වක |
| 2022 | දෙසැම්බර් | 25-ඉරිදා | නත්තල් උත්සව දිනය |

***රථවාහන නැවතුම් සීමාව සහ රථ වාහන නැවතුම් ගාස්තු නිවේදනය කිරීම -2022 වර්ෂය-***

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 157(14)(අ) වගන්ති ප්‍රකාරවත් ඊට අදාළ අතුරු ව්‍යවස්ථාවන් යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරවත් බළන්ගොඩ නගර සභා බලසීමාවේ රථ වාහන නතර කිරීමේදී රථවාහන නැවතුම් ගාස්තු අය කරනු ලබන සීමාව පහත I වන උප ලේඛනයේ සවිස්තරාත්මකව දක්වන ලද ආකාරයටත්, එම සීමාව ඇතුළත නතර කරනු ලබන එක් එක් රථ වාහනයකින් එක් දිනයකට අයකළ හැකි උපරිම ගාස්තු මුදල පහත II වන උප ලේඛනයේ සවිස්තරාත්මකව දැක්වෙන ආකාරයට විය යුතු වේ.

**ඉහත කී I වන උපලේඛනය**

බළන්ගොඩ නගර සභා බල සීමාවේ වෙළඳපල සීමාව ලෙස නම්කර ඇති සීමාවේ කොටසක් වන බළන්ගොඩ බදුල්ල මාර්ගයේ කිරිඳිගල පල්ලිය (වැලිහරනාව හන්දිය) දක්වා ද, බළන්ගොඩ රාස්සගල පාරේ කොන්වන්ට් විදුහල දක්වා ද, බළන්ගොඩ රත්නපුර මාර්ගයේ HLW ඉන්ධන පිරවුම්හල දක්වාද, බළන්ගොඩ කල්තොට පාරේ ධර්මරත්න බස්නායක මහතාගේ නිවස දක්වාද, දොරවෙල නව අතුරු මාර්ගය( මොහාන් සාලිය එල්ලාවල මාවත) ද, ඇතුළත් වන පරිදි බළන්ගොඩ නගරයේ කෙළින් වීදිය, තානායම් පිවිසුම් පාර, බාන්ස් රත්වත්ත මාවත, බස් නැවතුම්පල පාර, පල්ලිය පාර හා ඒ ඇතුළත ඇති සියලුම වීථීන් හා වීථීන් දෙපස ගොඩනැගිලි සීමාව ඇතුළත වන සීමාව වේ.

**ඉහත කී II වන උපලේඛනය**

- ලොරියක්, බස්රථයක් හෝ වෙන යම් වාහනයකින් - රු. 50.00
- වෑන් රථයක්, ජීප් රථයක් - රු. 40.00
- මෝටර් කාර් රථයක් හෝ මෝටර් රථයක් - රු. 30.00
- ත්‍රී රෝද රථයක් - රු. 20.00

***2022 වර්ෂය සඳහා විනෝද බදු අය කිරීම.***

විනෝද බදු ආඥා පනතේ 06 වන වගන්තිය අනුව බලංගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ සිනමා ශාලා වල සිනමා දර්ශන සඳහා නිකුත් කරන ටිකට් පතක මුහුණත වටිනාකමින් 7.5% ක්ද ,අනෙකුත් විනෝද කටයුතු සඳහා ටිකට්පතක මුහුණත වටිනාකම රු,100.00 නොඉක්මවන අවස්ථාවක 20% ක ප්‍රතිශතයක්ද, ටිකට්පතක මුහුණත වටිනාකම රු,100.00 ට වැඩි අවස්ථාවක 25% ක විනෝද බදු ප්‍රතිශතයක් අය කරනු ලබන බවත් එය 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා පැවසුවේ සුනඛයන් පාලනය කිරීම සඳහා අවශ්‍ය බලය පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති බැවින් ඒ සඳහා යම් යම් තීරණයන් ඉදිරියේ දී ගත යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, 2022 වර්ෂයට අදාල මෙම වාර්තාවේ පවතින වර්ෂයේ බදු හා ගාස්තු පැනවීම්වල වෙනසක් හෝ වෙනත් නව යෝජනාවන් ඇතුලත්ව පවතින්නේදැයි විමසීය.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පැවසුවේ ඉන්ධන, ටයර් ඇතුළු බොහෝ ද්‍රව්‍යවල මිල ගණන් වැඩිවෙමින් පවතින බැවින් මේ සම්බන්ධව මධ්‍යස්ථව සලකා බලා 2022 වර්ෂයේ ගාස්තු පැනවීමේ දී ගලි බවුසර් සේවාව වෙනුවෙන් පවතින ගාස්තුව රු. 250.00 කින් හා කොම්පෝස්ට් පොහොර කිලෝ ග්‍රෑම් 01 ක මිල රු. 2.00 කින් වැඩි කිරීම සිදු කළ නමුත් අනෙකුත් සියලුම සේවාවන් සඳහා පවතින ගාස්තුවම පනවා ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් බදු හා ගාස්තු පැනවීම් සම්බන්ධව මෙවැනි වාර්තාවක් ලබා දීමේ දී වාර්තාව තුළ පැවති ගාස්තුව සඳහන් කර වෙනම තීරුවක් ඇතුලත් කර තිබුණේ නම් පැහැදිලිව සංශෝධනයන් හඳුනා ගැනීමට හැකි බව පවසන ලදී.

එමෙන්ම සුසාන භූමි ගාස්තු යටතේ මිනියක් මිහිදන් කිරීම සඳහා වන රු 1,300.00 ක ගාස්තුව රුපියල් 750.00 ක් දක්වා අඩු කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා යෝජනා කළ අතර, ගරු උප සභාපති එම්. ටී. එම් රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 2022 ජනවාරි මස 01 දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා වර්ෂයක කාලයකට අදාලව පහත සඳහන් ක්ෂේත්‍රයන් සඳහා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම වෙනුවෙන් විවෘත ටෙන්ඩර් කැඳවීමට සහා අනුමැතිය ලබා ගැනීම හා අවම ලංසු මුදල තීරණය කිරීම

i. නගරයේ පෞද්ගලික බස්ගාල් ගාස්තු අය කිරීම හා අවම ලංසු මුදල තීරණය කිරීම (පසුගිය වර්ෂයේ බදු දීමේ දී පිළි ගනු ලැබූ මුදල රු. 110,550.00)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව සිදු කළ දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව පසුගිය වර්ෂයේ බදු දීමේ දී පිළි ගනු ලැබූ රු. 110,550.00 ක මුදලට 10% ක් වැඩි කර, අවම ලංසු මුදල වශයෙන් රු. 121,605.00 ක

මුදල සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ii. නගරයේ රථවාහන නැවතුම් ගාස්තු අය කිරීම හා අවම ලංසු මුදල තීරණය කිරීම (පසුගිය වර්ෂයේ බදු දීමේ දී පිළි ගනු ලැබූ මුදල රු. 167,300.00)

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව පසුගිය වර්ෂයේ බදු දීමේ දී පිළි ගනු ලැබූ රු. 167,300.00 ක මුදලට 10% ක් වැඩි කර, අවම ලංසු මුදල වශයෙන් රු. 184,030.00 ක මුදල සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

iii. පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩය හා පොදු වෙළඳසැල අංක 16 දරණ හරක් මස් කඩය බදු දීම හා අවම ලංසු මුදල තීරණය කිරීම
(පසුගිය වර්ෂයේ බදු දීමේ දී පිළි ගනු ලැබූ මුදල
- අංක 15 දරණ එළු මස් කඩය රු. 30,350.00
- අංක 16 දරණ හරක් මස් කඩය රු. 756,000.00 )

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව සිදු කළ දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව අංක 15 දරණ එළු මස් කඩය සඳහා පසුගිය වර්ෂයේ බදු දීමේ දී පිළි ගනු ලැබූ රු. 30,350.00 ක මුදලට 10% ක් වැඩි කර, අවම ලංසු මුදල වශයෙන් රු. 33,385.00 ක මුදල සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී ගුණරත්න මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථිර කරන ලදී.

එමෙන්ම අංක 16 දරණ හරක් මස් කඩය සඳහා පසුගිය වර්ෂයේ බදු දීමේ දී පිළි ගනු ලැබූ රු. 756,000.00 ක මුදලට 10% ක් වැඩි කර, අවම ලංසු මුදල වශයෙන් රු. 831,600.00 ක මුදල සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා කළ යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම නිසා ටෙන්ඩර් කිරීමට නොහැකි වූ පහත සඳහන් ක්ෂේත්‍ර ටෙන්ඩර් කිරීම සඳහා නැවත සභා අනුමැතිය ලබා ගැනීම

i. බළන්ගොඩ නගර සභාව සතු දැන්වීම් පුවරු 10 ක් ටෙන්ඩර් කිරීම සඳහා ප්‍රාදේශීය ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීම

ii. බළන්ගොඩ නගර සභාව සතු මහජන පොළ ආපන ශාලාව ටෙන්ඩර් කිරීම සඳහා ප්‍රාදේශීය ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම නිසා පහත ක්ෂේත්‍රයන් සඳහා සහන ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

i. පෞද්ගලික බස් රථ නැවතුම් ගාස්තු
ii. රථවාහන නැවතුම් ගාස්තු

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව සිදු කළ දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව නිරෝධායන ඇඳිරි නීතිය පැන වූ අගෝස්තු 21 සිට සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ පෞද්ගලික බස් රථ නැවතුම් ගාස්තුව හා රථවාහන නැවතුම් ගාස්තුව 100%කින් නිදහස් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:17 වැටුප් විෂය සඳහා පවතින වසර 15 ක් පමණ පැරණි පරිගණකයට අදාල මොනිටරය ක්‍රියා විරහිත වී ඇති අතර, අලුත්වැඩියා කිරීමට නොහැකි බැවින් අඟල් 19 නව මොනිටරයක් ලබා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 ගලි බවුසර් සේවය ලබා ගැනීම වෙනුවෙන් මුදල් සභාව වෙත ගෙවූ නමුත් වැසිකිළි වල ඉවත් කිරීමට සුදුසු තත්ත්වයක නොපැවතීම හේතුවෙන් සේවා සැපයීම නොකිරීම නිසා පහත නම් සඳහන් අය වෙත නැවත මුදල් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

i. බළන්ගොඩ, බෝම්බුව, දෙවන පටුමග,18/8 ලිපිනයේ පදිංචි එස්. සාවිත්‍රී මිය් රු. 5,000.00

ii. බළන්ගොඩ, ෆලීල් හාජ්ජියාර් මාවත, සී. 05, ඒ. එස්. මුබාරක් මයා - රු. 8,750.00

iii. බළන්ගොඩ, මාවෙල, කැටගොඩ, කේ. උපුල් ප්‍රේමතිලක මයා - රු. 8,750.00

iv. බළන්ගොඩ, වැලිපතයාය, නො. 12, එම්. එස්. චන්ද්‍රසේන මයා - රු. 16,625.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 පළාත් සභා හා පළාත් පාලන කටයුතු අමාත්‍යාංශය මගින් දැනුම් දී ඇති පරිදි ළමා හා කාන්තා ආරක්ෂණ කමිටුවක් පත් කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා,

- ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමිය
- ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය
- ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
- ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය
- ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය

පත් කිරීමට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් ළමා හා කාන්තා ආරක්ෂණය වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වැඩසටහන් රැසක් පවත්වාගෙන යන අතර, තමන් සහ ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය මේ සඳහා සම්බන්ධ වී ඇති බව ද එහි ආයතන ගණනාවකම නියෝජිතයින් සිටින බව ද සමාජ ආර්ථික ගැටලු ආදිය සාකච්ඡා කරන අතර, වගකීමක් ඇතිව කළ යුතු කර්තව්‍යයක් බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන ග්‍රාමීය මාර්ග සංවර්ධනය වැඩසටහන යටතේ පහත සඳහන් මාර්ග සංවර්ධනයන් සිදු කිරීම සඳහා නම් කර ඇති සමිති වෙත ලබා දීමට සහ අනුමැතිය ලබා ගැනීම

i. පල්ලෙවෙල වෙල අද්දර මාර්ගය සංවර්ධනය කිරීම - වැවවත්ත ප්‍රජා එකමුතු සංවිධානය වෙත ලබා දීම
ii. බුලත්ගම බෝධිය අසල මාර්ගය කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීම - වැවවත්ත ප්‍රජා එකමුතු සංවිධානය වෙත ලබා දීම
iii. පල්ලෙකුඹුර මාර්ගය සංවර්ධනය කිරීම - කුමාරගම ගැමුණු එක්සත් අවමංගල්‍යාධාර සමිතිය වෙත ලබා දීම
iv. බුලත්ගම ගම්පහ ගෙදර මාර්ගය සංවර්ධනය කිරීම - තුඹගොඩ සුහසරණ වැඩිහිටි සමිතිය වෙත ලබා දීම

v. තලංගම යක් එරමුදුකැටිය නිමල් කඩේ අසල සිට මාර්ගය සංවර්ධනය කිරීම - මාළිගාතැන්න එක්සත් සුභ සාධන සමිතිය වෙත ලබා දීම
vi. මුගුණමලේ ඉත්තගල හේන මාර්ගය සංවර්ධනය කිරීම - ශ්‍රම උදාන සුභ සාධක සංවිධානය
vii. ෆලීල් හාජ්ජියාර් මාවත උඩ කොටස පළමු පටුමග කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීම - කුමාරගම අනඳමෙත් ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමය
viii. වතුකාරගොඩ මාර්ගය සංවර්ධනය කිරීම- බෝම්මුව මෙත් සිත් සංවිධානය
ix. ශ්‍රී ධර්මානන්ද පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම - මිරිස්වත්ත දෙහිගස්තලාව එකමුතු සුභසාධක සමිතිය

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විමසුවේ මෙම සංවර්ධන කටයුතු සඳහා මුදල් ලැබෙන්නේ කෙසේද යන්නයි.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පැවසුවේ ග්‍රාම නිළධාරී වසම් සඳහා ලබා දුන් මුදල් ප්‍රතිපාදන මඟින් සිදු කරනු ලබන කර්මාන්ත මෙහි සඳහන්ව ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ ව්‍යපෘති සඳහන් නොවීමට හේතු කුමක්දැයි විමසන ලදී.

මේ සම්බන්ධව කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 බැංකියවත්ත ගලි ප්‍රතිකාරක පද්ධතියේ වියලුම් කුටීර සකස් කිරීම (බැංකියවත්ත කසළ මධ්‍යස්ථානයේ මළ අපද්‍රව්‍ය ප්‍රතිකාර ඒකකය සංවර්ධනය කිරීම) සඳහා බුලත්ගම එක්සත් මිතුරු සංසදය වෙත ලබා දීමට 2021-08-10 දිනැති මහ සභාවේ දී අනුමැතිය හිමි වූ නමුත් එම සංසදය හට වෙනත් ඉදිකිරීම් කොන්ත්‍රාත් දෙකක වැඩ අවසන් නොවීම හේතුවෙන් හැකියා සහතිකයක් ලබා ගැනීමට නොහැකි වී ඇති අතර, ඒ අනුව එම කොන්ත්‍රාත් කටයුත්ත තුඹගොඩ සුහසරණ වැඩිහිටි සමිතිය වෙත ලබා දීමට සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:22 RB 4786 දරණ ට්‍රැක්ටර් රථයේ එන්ජිමෙහි ගියර් පෙට්ටියේ රේසරයේ ශබ්දයක් එන බැවින් පරීක්ෂා කර අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:23 කොම්පෝස්ට් අංගනය සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|
| විල්බැරෝ (Heavy) | 02 |
| උදලු 9X9 | 03 |
| වක් පිහි | 01 |
| උස බාල්දි (ලීටර 100) | 10 |
| බල්බ් (12 W) | 15 |
| ග්ලවුස් (රබර් මිශ්‍ර රෙදි) | 20 |
| බූට්ස් (කහ) | 20 |
| මාස්ක් (කලු පාට KN 95) | 80 |
| මැසි බෙහෙත් | පැකට් 20 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:24 වීථි පහන් අලුත්වැඩියාව සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|
| සෙරමික් ස්ටූ හෝල්ඩර් | 100 |
| බ්‍රැකට් | 35 |
| ඇණ (කණු ඇණ අවම අඩියක සනකමැති) | 35 |
| වයර් 15 A (Pecsibel) | 100 m |
| පොටෝ ෂෙල් (10A) | 20 |
| කන්ටැක්ටර් (32A) | 20 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:25 RC 1118, HF 8558,RD 8240, RG 4786 යන ට්‍රැක්ටර් රථවල රියදුරු අසුනට උඩින් ඇති වහල (කැනපීන්) අබලන් වී ඇති බැවින් අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:26 HF 8558 අංක දරණ ට්‍රැක්ටර් රථය සඳහා 90 AMP Lucas වර්ගයේ වසර දෙකක වගකීමක් ඇති බැටරියක් චමින්ද බැටරි මාට් වෙතින් රු. 19,760.00 ක මිලකට ලබා ගැනීම හා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:27 "බණ්ඩාරකුඹුර, උයන්ගහවත්ත, මහ උයන්වත්ත" නැමැති බළන්ගොඩ නගර සභාව සඳහා පවරා ගැනීමට යෝජිත ඉඩම අත්පත් කර ගැනීමට හා ඒ සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තු මුදලින් 25% ක මුදල වන රු. 312,500.00 ක මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව  කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව "බණ්ඩාරකුඹුර, උයන්ගහවත්ත, මහ උයන්වත්ත" නැමැති බළන්ගොඩ නගර සභාව සඳහා පවරා ගැනීමට යෝජිත ඉඩම අත්පත් කර ගැනීමට හා ඒ සඳහා මූලික අදියරේ ගෙවීම් වශයෙන් රුපියල් තුන් ලක්ෂ දොළොස් දහස් පන්සියයක (312,500.00) මුදලක් බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කිරීම සඳහා ගරු සභාපතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:28 HF 8952 ට්‍රැක්ටර් රථයේ පහත සඳහන් අලුත්වැඩියා කිරීම සඳහා ( රජයේ වාහන නඩත්තු කිරීම 30/2016 චක්‍රලේඛය අනුව) එම ට්‍රැක්ටර් රථය ගලවා පරීක්ෂා කර බැලූ තෙබුවන ගරාජය වෙතින් ඉදිරිපත් කර ඇති රු. 216,400.00 ක ඇස්තමේන්තුව සඳහා සභා අනුමතිය ලබා ගැනීම

- ගියර් බොක්ස් එක සම්පූර්ණයෙන්ම අලුත්වැඩියා කිරීම - රු. 56,000.00
- පිටුපස පීනියන් සහ ස්පයිඩර් වීල් රේසර් දැමීම - රු. 45,000.00
- ඉන්ජෙක්ටර් පොම්පය අලුත්වැඩියා කිරීම සහ ඉන්ජෙක්ටර් නොසෙල් අලුතින් දැමීම - රු. 40,000.00
- ගියර් බොක්ස් ලීටර් ඔයිල් 36 ක් දැමීම - රු. 41,400.00
- අලුත්වැඩියා කිරීමේ කුලිය - රු. 34,000.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:29 සභාවේ අනුමත කර්මාන්ත සඳහා අවශ්‍ය සිමෙන්ති (SLS 107 වර්ගයෙන්) හා අනෙකුත් ඉදිකිරීම් ද්‍රව්‍ය (ජී අයි බට, කම්බි, ජල උපාංග, විදුලි අයිතමයන්) මිළදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවනු ලැබුවත්, රට තුළ පවතින මිළ උච්චාවචනය හේතුවෙන් වෙළඳසැල් හිමියන් විසින් මිළ ගණන් ලබා දීම ප්‍රතික්ෂේප කරන බැවින් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීම හා ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව ගණකාධිකාරීතුමා සමග කරුණු සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්. ටී. එම්. රුමී මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව රුපියල් ලක්ෂයක උපරිමයකට යටත්ව අත්තිකාරමක් ලබා ගෙන බිල්පත් මඟින් එම අත්තිකාරම පියවීමේ පදනම අනුව සිමෙන්ති හා අනෙකුත් ඉදිකිරීම් ද්‍රව්‍ය (ජී අයි බට, කම්බි, ජල උපාංග, විදුලි අයිතමයන්) වෙළඳපොළේ පවතින සාධාරණ මිල ගණන් යටතේ මිල දී ගැනීම හා

එසේ මිළදී ගැනීමේ දී වෙළඳපොළ මිල ගණන් පිළිබඳව සෑහීමකට පත්වන නිළධාරියා වශයෙන් ගණකාධිකාරීතුමාව පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

07:01:01 E- Library ඉදිරිපිට පාර නඩත්තු කිරීම

07:01:02 උඩකන්ද පාර කාණු නඩත්තු කිරීම

07:01:03 කරව්කැටිය හන්දියේ කපා ඇති කාණුව පිළිසකර කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය, E- Library ඉදිරිපිට පාර අබලන් වී ඇති බැවින් එය නඩත්තු කර දෙන ලෙස ද උඩකන්ද මාර්ගයේ කාණුවේ යම් ප්‍රමාණයක් නඩත්තු කර නවතා ඇති අතර, මේ නිසා ජලය ගලා යාමෙන් මාර්ගය කැඩී යන බැවින් එම කොටස නඩත්තු කර දෙන ලෙස ද කරව්කැටිය හන්දියේ කපා ඇති කාණුව පිළිසකර කර නොමැති බැවින් එය ඉටු කර දෙන ලෙස ද පවසන ලදී.

මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, E- Library ඉදිරිපිට පාර හැකි ඉක්මනින් නඩත්තු කරන ලෙස ද ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙන් ප්‍රිමික්ස් ඉල්ලා ගැනීමට කටයුතු කරන ලෙස ද වැඩ අධිකාරීතුමාට පැවසූ අතර, ඉතිරි නඩත්තු කටයුතු- දෙක සිමෙන්ති ගැටලුව නිසා නැවතී ඇති බැවින් සිමෙන්ති මිල දී ගෙන හැකි ඉක්මනින් අවසන් කරන ලෙස ද පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**ප.ව 2.15 ට පමණ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා සභාවෙන් පිටවන ලදී.**

**07:02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07:02:01 වැවවත්ත උද්‍යානයේ ප්‍රධාන මාර්ග පද්ධතිය ග්‍රාමීය මාර්ග කාපට් ව්‍යාපෘතිය යටතේ රුපියල් ලක්ෂ 116 ක් වියදම් කර සම්පූර්ණයෙන් සංවර්ධනය කරන ලදී. එහි අතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කර්මාන්ත කමිටුවට යෝජනා කිරීම

07:02:02 වැවවත්ත ප්‍රජා ශාලාවේ වැසිකිළි අලුත්වැඩියා කිරීමට කර්මාන්ත කමිටුවට යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා 07:02:01 යටතේ අතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කර්මාන්ත කමිටුවට තමන් යෝජනා කරන

අතර, 07:02:02 යටතේ වැවවත්ත ප්‍රජා ශාලාවේ වැසිකිළි අලුත්වැඩියා කර දෙන ලෙස තමන් යෝජනා කළ නමුත් එය කාර්මික නිළධාරීතුමා සිදු කර ඇති බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

07:03:01 ආනන්ද මෛත්‍රී මාවත ප්‍රධාන මාර්ගයේ ගලා බසින වැසි ජලය නිසා ටී. කේ. බී. බම්බ්ර් මහතාගේ නිවසට හා ඉඩමට විශාල හානියක් සිදුවන බැවින් එම කාණු පද්ධතිය නඩත්තු කර හානිය අවම කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඉල්ලීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රීනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය, වර්ෂා කාලයේ දී ජලය විශාල ප්‍රමාණයක් ඉහත නම් සඳහන් පුද්ගලයාගේ ඉඩමට හා නිවසට ගලා එන බැවින් ජලය බැස යාමට හැකි පරිදි කාණු පද්ධතිය නඩත්තු කර දෙන ලෙසද මීටර 100 ක් පමණ කුඩා කොටසක් පමණක් නඩත්තු කිරීමට පවතින බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් මෙම ස්ථානය පරීක්ෂා කර බලා විධායක ඉංජිනේරු වාර්තාවක් ලබා ගෙන අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් වැඩ අධිකාරීතුමාට පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04 ගරු නාගරික මන්ත්‍රීනී එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය**

07:04:01 බළන්ගොඩ, ඇල්ලෙපොල, සරස්වතී පාරේ අතුරු පාරක් වන දයා ආරියවතී මියගේ නිවස අසලින් දිවෙන පාර සුදුසු අයුරකින් නඩත්තු කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රීනී එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය, මේ සම්බන්ධව ඉදිරිපත් කර ඇති ලිපිය කියවූ අතර, එම ලිපියට අනුව මාර්ගය අනතුරුදායක තත්ත්වයක් බවට පත්ව ඇති බැවින් නඩත්තු කටයුත්තක් වශයෙන් මෙම මාර්ගය පිළිසකර කර දෙන ලෙස ද මීට පෙර අවස්ථාවක දී මෙම යෝජනාව ඉදිරිපත් කරනු ලැබූ බව ද පවසන ලදී.

එමෙන්ම උඩ ඇල්ලෙපොල කේ. මල්ලිකාරත්න යන අය විසින් 378/06 නිවසට යාමට ඇති කොන්ක්‍රීට් පාර පිපිරී ඇති අතර, ආපදාවකට ලක් විය හැකි බව පවසා ලිපියක් යොමු කර ඇති බවත්, ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් පවසන ලදී.

මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, තනි නිවසක් බැවින් මෙය ඉටු කිරීමට නොහැකි නමුත් නගර සභාව මඟින් පළාත් සභාවට ඉල්ලීමක් කළ හැකි බව පැවසීය. මෙහි දී ගරු උප සභාපතිතුමා පැවසුවේ ඉදිරියේ දී රුපියල් ලක්ෂ 10 ක මුදල් ප්‍රතිපාදනයක් ගරු නාගරික මන්ත්‍රීනී එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමියට ලැබීමට නියමිතව පවතින බැවින් එමඟින් මෙය ඉටු කර ගන්නා ලෙසද ඒ සඳහා තමන්ගේ සහයෝගය ද ලබා දෙන බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05 ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

07:05:01 අංක 197/7 දරණ පදික කඩ කාමරය එස්. සුරේෂ් කුමාර් යන අයට අයත්ව තිබූ අතර, ඔහු මිය ගිය බැවින් එම කඩ කාමරය පසු අයිතිය නම් කර ඇති පී. අන්තෝනි අම්මා යන අය වෙත ලබා දීමට යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය එස්. සුරේෂ් කුමාර් යන කොවිඩ් ආසාදිතව මිය ගොස් ඇති අතර, ඔහු විසින් පී. අන්තෝනි අම්මා යන අයව ජීවත් කරවා ඇති බව ද පසු අයිතිය ඇය වෙත නම් කර ඇති බැවින් හා පදික වෙළඳාමෙන් දිවි ගෙවන පවුලක් බැවින් අංක 197/7 දරණ පදික කඩ කාමරය ඇය වෙත ලබා දෙන ලෙස ද එමෙන්ම මේ සඳහා ඉල්ලීම් ලිපියක් සභාව වෙත ලබා දී ඇති බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06 ගරු නාගරික මන්ත්‍රිනී අයි.ඒ.එම්. ඉලංකෝන් මැතිතුමිය**

07:06:01 ඇල්ලෙපොල සරස්වතී පාරේ කාපට් අතුරා ඇති මාර්ගයේ එක් පසක කාණු ප්‍රතිසංස්කරණය අතරමග නවත්වා ඇති බැවින් වතුර බැස යාමට බාධා සිදුවීම හේතුවෙන් එම ජනතාව අපහසුතාවයට පත්ව ඇති අතර, එම මාවතේ කාණු පද්ධතිය නිසියාකාරව ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී එම්. ජී. ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී අයි. ඒ. එම්. ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් වතුර බැස යාමට බාධා සිදුවීම හේතුවෙන් එම ජනතාව අපහසුතාවයට පත්ව ඇති අතර, එම මාවතේ කාණු පද්ධතිය නිසියාකාරව ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස පවසන ලදී.

මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, ගම්පෙරළිය මගින් විශාල වැඩ කොටසක් සිදු කර ඇති අතර, කොට්ඨාස සඳහා මන්ත්‍රීවරුන් සඳහා ලැබෙන මුදල් ප්‍රතිපාදනවලින් මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර ගන්නා ලෙස ද පවසන ලදී.

**ප.ව 2.30 ට පමණ ගරු නාගරික මන්ත්‍රිනී එම්. ජී. ශාන්තිලේඛා මහත්මිය සභාවෙන් පිටවන ලදී.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**ප.ව 2.35 ට පමණ ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය සභාවෙන් පිටවන ලදී.**

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

**2021-09-01 සිට 2021-09-30 දක්වා ආදායම් හා වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | **5,839,452.83** |
| වෙනත් ලැබීම් | **4,233,176.25** |
| මුලු ලැබීම් | **10,072,629.08** |
| පුනරාවර්තන වියදම් | **9,191,119.09** |
| වෙනත් වියදම් | **1,800.00** |
| මුලු වියදම් | **9,192,919.09** |

මේ සම්බන්ධව අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, ආදායම් වියදම් වාර්තාවේ 2021 ජූලි මස සහ සැප්තැම්බර් මස ආදායම් වියදම් සම්බන්ධව මහජන පොළ, පොදු වෙළෙඳපොළ උදාහරණයට ගනිමින් සංසන්දනාත්මක විග්‍රහයක් සිදු කළ අතර, ඒ අනුව ලක්ෂ 31 ක් පමණ වන විශාල ආදායමක් සභාවට අහිමි වී ඇති බව ද නිරෝධායන ඇඳිරිනීතිය පැනවූ කාල සීමාවේ ආදායම අඩු වී ඇති නමුත් ජල හා විදුලි පරිභෝජනය වැඩි වී ඇති බව ද මේ සම්බන්ධව අදාල විෂය භාර නිළධාරීන් සොයා බලා කටයුතු කළ යුතු බව ද පවසන ලදී.

එමෙන්ම නිරෝධායන ඇඳිරිනීතිය පැන වූ කාල සීමාවේ පොදු වැසිකිළි භාවිත නොවුණත් ජල හා විදුලි බිල් ලැබී ඇති අතර, ඒ සම්බන්ධව ටෙන්ඩර්කරු විසින් කරන ලද ඉල්ලීම සාධාරණ බව ද බළන්ගොඩ සතිපොළෙහි පවිත්‍රතා සේවකයන්ට පහර දීමක් සිදු වී ඇති බවට පත්තර වාර්තාවක් පවතින අතර, මත්ද්‍රව්‍ය හා වෙනත් අකටයුතුකම් මෙම ස්ථානයේ සිදුවන බව ද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා මේ සම්බන්ධව ලිපි ලබා දෙමින් දැනුවත් කිරීම් සිදු කළ නමුත් තවමත් අදාල කාර්යයන් සිදු කර නොමැති බව ද වැඩි දුරටත් පවසන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් අදාල සෞඛ්‍ය පරිපාලක වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇති නමුත් අදාල රාජකාරී කටයුතු සිදු නොවී ඇති බව පැවසීය.

**2021-09-01 සිට 2021-09-30 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 15,207.00 |
| 227-5020 | 37,355.00 |
| RD - 8240 | 20,757.00 |
| 226-7521 | 13,320.00 |
| BC-0005 | 25,600.00 |
| GC 0001 | 4,710.00 |
| LL - 7688 | 8,880.00 |
| DDR 0008 | 2,220.00 |
| JD-4684 | 1,570.00 |
| LL-2110 | 5,550.00 |
| ND-5124 | 27,222.75 |
| PF-4006 | 18,537.12 |
| QL-2901 | 4,082.00 |
| RC-1107 | 25,037.50 |
| RE 2600 | 13,131.00 |
| 37-7933 | 10,517.00 |
| HF 8558 | 1,110.00 |
| VI 1833 | 1,256.00 |
| RB 4786 | 18,676.00 |
| RC 1118 | 11,100.00 |
| UQ 1933 | 3,140.00 |
| **එකතුව** | **268,978.37** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**10. ඇස්තමේන්තු අනුමත කිරීම**

10:01 **ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

10:01:01 පල්ලෙවෙල සුසිලා මහත්මියගේ නිවස ඉදිරිපිට කාණුව නඩත්තු කිරීම සඳහා වන ඇස්තමේන්තු මුදල රු. 458,953.79

10:01:02 වැලිහරනාව පරණ ජල ටැංකියට යන මාර්ගයේ ජල සම්පාදන නිල නිවාසවලට පහළින් ඇති ඉතා අවදානම් මාර්ගය නඩත්තු කිරීම සඳහා වන ඇස්තමේන්තු මුදල රු. 280,884.65

ඉහත සඳහන් ඇස්තමේන්තු යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**11. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පරගහකුඹුර මාර්ගයේ වැඩ ආරම්භ කර තිබීම සම්බන්ධව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බව ද එහි වෙල කොටස මේ සමගම ඉටු කර දෙන ලෙස ද ඉල්ලා සිටිමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් ඇල්ලෙපොල අනතුරුදායක පොල් ගසක් ඉවත් කර දෙන ලෙස මීට පෙර අවස්ථාවක දී ඉල්ලීම් කළ අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෙළීමේ බලපත්‍රය ලබා දෙන බව පැවසූ බව ද තවමත් මෙම ගස ඉවත් කර නොමැති බැවින් එය හැකි ඉක්මනින් ඉටු කර දෙන ලෙස ද ගම්වල තිබෙන වෙළඳසැල්වල තරාදි පඩි ලයිසන් කරනු ලබන දිනය හා වේලාව සම්බන්ධයෙන් එම වෙළඳසැල් හිමියන්ව දැනුවත් කිරීම සඳහා යම් කිසි වැඩපිළිවෙලක් සකස් කර දෙන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහි දී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, ඇල්ලෙපොල අනතුරුදායක පොල් ගස ඉවත් කිරීම සම්බන්ධ හෙළීමේ බලපත්‍රය ලැබී ඇත්දැයි සොයා බලා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන මෙන් වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවේ දී අක්කර 18 සමගි මාවතේ පිවිසුම් මාර්ගය අබලන් වී ඇති බැවින් නඩත්තු කර දෙන ලෙස ඉල්ලා සිටි අතර, එය ඉටු කර දෙන ලෙස ද කහටපිටිය පාර මුස්තාපා මාවත සම්පූර්ණයෙන්ම අබලන් වී ඇති අතර, ඒ සඳහා අවදානය යොමු කර ඉටු කර දෙන ලෙස ද දෙහිගස්තලාව ජෙයිලානි පාසල පාරේ වතුර බැස යාමට කාණුවක් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සකස් කළ ද එය ප්‍රමාණවත් නොවන නිසා වතුර නිවෙස්වලට යාමට හැකි බැවින් ගරු සභාපතිතුමාගේ අවදානය යොමු කර මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර කිසියම් පිළියමක් යොදන ලෙස ද දෙහිගස්තලාව පල්ලිය ඉදිරිපිට පාර ජේසීබී යන්ත්‍රය යොදා කැපූ නමුත් එය අතරමග නැවතී ඇති නිසා පාර කැඩී යාමෙන් අවදානම් තත්ත්වයක් මතුව ඇති බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවක කසළ එක්රැස් කරන්නන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව ලිපියක් මඟින් දැනුවත් කළ අතර, එහි වර්තමාන තත්ත්වය කුමක්දැයි විමසූ අතර, තවමත් වයස අඩු ළමුන් කසළ එක්රැස් කිරීමේ කටයුතුවල නියැලෙන බව දකින බව ද ඒ සම්බන්ධව හැකි ඉක්මනින් අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද පවසන ලදී.

එමෙන්ම පදික කඩවල අයිතිය වෙනස් කරන්නේ නම් එය සිදු කරන ක්‍රමවේදය කුමක්දැයි ගරු සභාපතිතුමාගෙන් විමසන ලදී.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පැවසුවේ වෙනත් පුද්ගලයෙක්ට අන්සතු කිරීමට පෙර එම කඩ සභාවට පැවරිය යුතු අතර, සබැවටම පදික වෙළඳාමෙන් ජීවත්වන බවට තහවුරු කරගෙන එම කඩ ලබා දීමට කටයුතු කරන බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, පදික කඩවල කුලිය ගෙවා ගැනීමට නොහැකි අයට ගන්නා ක්‍රියාමාර්ගය කුමක්දැයි විමසන ලදී.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පැවසුවේ මාස 02ක් කුලිය ගෙවන්නේ නැත්නම් තෙවන මාසය ඉක්මවීමට ප්‍රථම එම කඩය නගර සභාවට පවරා ගන්නා අතර, එහි දී කී මනි මුදල ආපසු ලබා නොදෙන බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් ගිවිසුමේ එසේ සඳහන්ව ඇත්නම් කළ හැකි අතර, එසේ නොමැති නම් කොන්දේසි කඩ කර ඇති බව පවසා සභාවට පවරාගෙන අනතුරුව සභාව මගින් ඉදිරියේ දී කළ යුත්තේ කුමක්දැයි තීරණය කළ යුතු බවත්, එහි දී කී මනි මුදල වන රු. 140,000.00 ක මුදල එම පුද්ගලයාට අහිමි වන බවත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා නැවත වරක් අදහස් දක්වමින් සංවර්ධන කටයුතු සඳහා තමන්ට ලැබෙන රුපියල් ලක්ෂ 20 ක මුදලින් සේනක පෙදෙස මාර්ගය සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන නමුත් එම මාර්ගයේ මැද සපු ගසක් හා පොල් ගසක් පවතින බැවින් සංවර්ධන කටයුතු කරගෙන යාමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති නිසා එය ඉවත් කරලීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටින බව පැවසූ අතර, ගරු සභාපතිතුමා එය කඩිනමින් ඉටු කර දෙන ලෙස වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

එමෙන්ම පසුගිය කාලයේ ගංවතුර හේතුවෙන් බළන්ගොඩ නගරය යට වූ බැවින් නැවතත් එවැනි තත්ත්වයක් ඇති නොවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස වරින්වර දැනුම් දුන් අතර, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාට ද වෙළඳ සංගමයක් වශයෙන් ඉල්ලීමක් කළ අවස්ථාවේ දී එතුමා තමන්ට ද පිටපතක් සහිතව ගරු වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන අමාත්‍යතුමා වෙත ලිපියක් යොමු කර ඇති බව පැවසීය.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසුවේ එම ලිපියට වැඩිමනක් වශයෙන් මෙය කඩිනමින් ඉටු කළ යුතු කාර්යයක් බව සඳහන් කර ලිපියක් සභාව මඟින් ද යොමු කිරීමට කටයුතු කරන බවයි.

මීට අමතරව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, අංක 67/1565 දරණ ට්‍රැක්ටර් ට්‍රේලරය දිරා ඇති බැවින් එහි තට්ටුව සකස් කර භාවිතයට ගත හැකි බව ද WPG 15/2637 දරණ කම්පැක්ටරය ඉවත් කර තිබෙන අතර, එය සකස් කර ප්‍රයෝජනයට ගත හැකි බව ද කරවිකැටිය වටරවුම් පාරේ පස්වන පටුමග අයින් දෙක කොන්ක්‍රීට් කර නඩත්තුවක් සිදු කර දෙන ලෙස ද ටෙලිකොම්, ඩයලොග් කණු ස්ථාපනය කර තිබීම සම්බන්ධ කටයුතු සොයා බැලීමට නිළධාරියෙකු පැමිණි අතර, ඒ සඳහා අවශ්‍ය ක්ෂේත්‍ර කටයුතු වෙනුවෙන් නගර සභාවේ නිළධාරියෙකු තමන්ට සම්බන්ධ කර දෙන ලෙස ද දිවයිනේ හොඳම දෙවන ඩිපෝව බවට බළන්ගොඩ ඩිපෝව පත් වූ බව ද එහි ඩිපෝ අධිකාරීතුමා ක්‍රිෂාන්ති ගුරුතුමියගේ පෞද්ගලික පන්ති පවත්වන ස්ථානය අසල පාර අයිනෙහි තම නිල වාහනය නවත්වා තබන අතර එම ස්ථානයේ වීදි ලාම්පුවක් නොමැති බැවින් වීදි ලාම්පුවක් ලබා දෙන ලෙසද ඒ ආසන්නයේ වීදි ලාම්පු නොදැල්වෙන බව තමන් දුටු බව ද පවසන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා පැවසුවේ මීටර් 100 ක් තුළ වීදි ලාම්පු 04ක් පවතින අතර තවත් වීදි ලාම්පුවක් සවි කළ හොත් විදුලි බල මණ්ඩලයෙන් එය ඉවත් කරන බව ද වෛද්‍ය ජයකොඩි මහතාගේ නිවස අසල පවතින වීදි ලාම්පුව ඇතැම් අවස්ථාවල දී නොදැල් වන්නේ ගේට්ටුව වසා තිබීම නිසා ස්විච් එක දැමීමට නොහැකි බැවින් බව ද එම ස්විච් එක ජෙයිලානි පාසල අසලට සවි කිරීමට විදුලි කාර්මික මහතාට පැවසිය යුතු බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා නැවත අදහස් දක්වමින් පොලිසිය අසල අලුතින් ඉදි කරනු ලබන ගොඩනැගිල්ලෙහි වහලය හේතුවෙන් එම මාර්ගයට බාධාවක් ඇති විය හැකි බැවින් ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද බොහෝ දුරාචාරයන් සිදුවන නිසා මහජන පොළ වැසිකිළියෙහි බැමි කොටස ඉවත් කර දෙන ලෙස ද වීරසුන්දරාරාම මාවතේ ජල සම්පාදන මණ්ඩලයෙන් හැරීමට ලක් කළ කොටස ඉක්මනින් සකස් නොකළහොත් අනතුරු සිදු විය හැකි බව ද අද දින පැමිණි ක්‍රීඩා උපදේශක මහත්වරුන් සඳහා තේ පැන් සංග්‍රහයක් ලබා දීමට හැකි වූවා නම් එය ඉතා වටිනා බව ද පාලම යට

පැන්තාලිය සකස් කර ගැනීමට අවස්ථාව සලසා දෙන ලෙස ද ඇවිදින මංතීරු ව්‍යාපෘතියත් සමඟ එළකිරි, කිතුල් හකුරු ආදිය අලෙවි කරන ස්ථානයක් පැවතීම වටිනා බැවින් සභාවෙන් ඒ සඳහා අවශ්‍ය ස්ථානය සකස් කර දෙන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් බුලත්ගම අස්වැද්දුම එපිටවත්ත මාර්ගයේ ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී නගර සභාවෙන් ජේසීබී යන්ත්‍රය ලබා දුන් නිසා වැඩ කටයුතු පහසු වූ බැවින් ඒ සම්බන්ධව ස්තුතිවන්ත වන බව ද රුපියල් ලක්ෂ 20 ව්‍යාපෘති සඳහා සමිති නම් ලබා දෙන ලෙස අදාල නිළධාරීතුමිය පැවසූ අවස්ථාවේ දී ගරු උපසභාපතිතුමා ද තමන් සමඟ සිටි බව ද කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කළ යෝජනාවක් අනුව සම්පූර්ණම කඩා වැටී තිබූ බෝක්කුවේ වැඩ කටයුතු ඉක්මනින් සිදු කර ගැනීමට තමන් විසින් කාර්මික නිළධාරී මහතා කැඳවාගෙන ගිය බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් ක්‍රීඩා පිටිය සම්බන්ධ අවශ්‍ය කරුණු ඉතා විවෘතව සාකච්ඡා කිරීම සම්බන්ධව ඉතාමත් සතුටු වන බව ද ක්‍රීඩා උපදේශක තමන්ගේ සහෝදරයා වුව ද තම මතය විවෘතව ප්‍රකාශ කරන බව පවසන ලදී.

එමෙන්ම තමන් විසින් අයවැය සම්බන්ධව ලිපියක් සභාවට යොමු කරන ලද්දේ යම් කාරණාවක් හේතු කරගෙන බව ද පසුගිය දිනක ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ සභා ගොඩනැගිල්ල විවෘත කරන අවස්ථාවට තමන් සහභාගී වූ අතර, ඒ සඳහා දේශපාලනයේ නිරත බළන්ගොඩ ප්‍රදේශයේ පක්ෂ විපක්ෂ සියලු දෙනාට ආරාධනා කර පැමිණි සිටි බව ද ගරු සභාපතිතුමාගේ නම එහි දී ප්‍රකාශ වූ බව ද ආණ්ඩුව මගින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා හරහා තම පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලැබෙන මුදල් ප්‍රතිපාදන වලින් කාපට් ව්‍යාපෘති, බෝක්කු හා ගොඩනැගිලි ආදී බොහෝ සංවර්ධන කාර්යයන් සිදු කරන බව ද අතිගරු ජනාධිපතිතුමා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් වලේබොඩ ගම්මානයට පැමිණීමෙන් පසු විශාල සංවර්ධන යෝජනා රැසක් ක්‍රියාත්මක කරමින් පවතින අතර,බළන්ගොඩ ප්‍රාදේශීය සභාවේ ද මෙවැනිම සංවර්ධන කටයුතු රැසක් සිදු වන නමුත් එම මුදල් ප්‍රතිපාදන සමඟ සැසඳීමේ දී බළන්ගොඩ නගර සභාවට ලැබෙන මුදල් මොනවා ද යැයි සිතෙන බව ද පවසන ලදී.

එබැවින් බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිවරයා වශයෙන් ඔබතුමා සිටිනවා නම් ඒ සඳහා බහුතර බලයක් තිබිය යුතු බව ද, තමන්ගේ පෞද්ගලික අමනාපකමක් නොමැති අතර, විවෘතව තම අදහස පවසන බවද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාගේ මැදිහත්වීමෙන් හා නගරයේ මන්ත්‍රීවරයා වශයෙන් ලාල් ගලප්පත්ති මැතිතුමාගේ වුවමනාව මත බළන්ගොඩ ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සිදු වන අතර, බළන්ගොඩ නගරයේ පවතින නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩමෙහි ව්‍යාපෘතියක් සිදු කිරීමට මෙන්ම පොදු වෙළඳසැල සංවර්ධනය කර ජනතාවට අවශ්‍ය සේවාවන් සැපයීමට දැඩි අවශ්‍යතාවයක් පවතින නමුත් මෙම බල අරගලය හේතුවෙන් ආණ්ඩුව මගින් විශාල මුදලක් ලබා

ගැනීමට ඇති හැකියාව අද වන විට නැති වී ගොස් ඇති බව ද ගරු සභාපතිවරයා වශයෙන් ඔබතුමාට මුදල් ප්‍රතිපාදන වෙන් කරගන්න කවුරුත් නොමැති බැවින් ඒ ගැන සිතන ලෙස ද වැඩිදුරටත් පවසන ලදී. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් 2019 අයවැය පරාජය වූ පසු ගරු සභාපතිවරයා වශයෙන් ඔබතුමා තම බලය භාවිත කර පනතේ එක්තරා වගන්තියක් මඟින් වැඩ කරමින් ගිය අතර, ඊළඟ අයවැයේ දී එසේ කළ නොහැකි වුවත් යම් කිසි නීතිමය රාමුවක් අනුව හා අපගේ යම් අඩුපාඩුවක් නිසා රැඳී සිටින බව ද අප කාගේත් පරමාර්ථය ජනතාවට සේවය කිරීම බව ද අප විසින් ලබා දෙන නඩත්තු යෝජනා ක්‍රියාත්මක නොවන අතර, ගරු සභාපතිතුමාගෙන් අහන ප්‍රශ්න වල දී ගරු සභාපතිතුමා විසින් කාර්මික නිළධාරී හෝ වැඩ අධිකාරීතුමාගෙන් පිළිතුරු ලබා ගැනීමට කටයුතු කරන බව ද අර්බුදයක් ඇති නොකරගෙන තිබෙන ප්‍රශ්න විසඳගෙන සහෝදරයන් සේ වැඩ කිරීම කළ යුතු බව ද පැවසීය.

එමෙන්ම රිෂානා සර්විස් ආයතනය අසල කාණුවක් නොමැති නිසා වැසි ජලය ගලා යාමෙන් මාර්ගය කැඩී යන අතර, කර්මාන්ත කමිටුවට යොමු කර කාණුවක් සකස් කර දෙන ලෙස ද ඒ සම්බන්ධව නවස්දීන් යන අය විසින් කරන ලද ඉල්ලීම් ලිපිය මෙම අවස්ථාවේ දී ලබා දෙන බව ද කපු කඩේ පොඩි මහත්මයාගේ නිවස්වලට යන පාර බොහෝ කාලයකින් නඩත්තු වී නොමැති බැවින් එය ඉටු කර දෙන ලෙසද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

## 12. අවසානය

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් දේශපාලන පක්ෂ භේදයකින් තොරව රටක් වශයෙන් ඉතාමත් බැරෑරුම් අවස්ථාවකට අප මුහුණ දෙමින් සිටින අතර, තමන්ගේ තිබෙන එකමුතුවක් නොමැතිකම හා දුර්වල පරිපාලනය මත රටේ විශාල ප්‍රශ්න රැසක් ඇති කරගෙන ඇති බව ද ජනතාවට ජීවත් වීමට අපහසු තත්ත්වයකට පත්ව ඇති බව ද ගෝලීය වසංගතයක් වශයෙන් පවතින කොරෝනා වසංගතය ඉදිරියට යොදා ගෙන මහා පරිමාණ ව්‍යාපාරිකයන්ට විශාල වශයෙන් මුදල් ඉපයීමට අවස්ථාව උදා කර දී තිබෙන බව ද බඩු මිලෙහි ඉහළ යාම මඟින් සියලුම දෙනාට ඒ බව දැන ගන්නට හැකි වන බව ද ජනතාව අතර පොදුවේ බෙදෙන්නට තිබෙන සම්පත් 2/3 ක් පමණ තමන් සතු කරගෙන ඉතිරි 1/3 ජනතාවට භුක්ති විඳින්න දී තිබෙන බව ද ගරු උප සභාපතිතුමාට රාජ්‍ය සේවකයෙක් වශයෙන් ජීවන වියදමත් සමඟ ලැබෙන පඩිය කොතරම් ප්‍රමාණවත් ද යන්න වැටහෙනු ඇති බව ද පවසන ලදී.

එමෙන්ම සංඛ්‍යාලේඛන සත්‍ය දැයි නොදන්නා අතර, කොරෝනා ව්‍යාප්තිය සම්බන්ධ දත්ත සමඟ රට හොඳ තත්ත්වයක පවතින බව පෙනෙන්නට තිබෙන බව ද ජනතාවට ජීවත් වීමට තිබෙන මාර්ගයන් නිරාකරණය කර දී නිවැරදිව ගමන් කළ හොත් රටේ මේ වන විට මතු වී තිබෙන පහළ බැසීම යම් තරමකින් හෝ ඉහළ නැංවිය හැකි බව ද දේශපාලනයේ පුද්ගලික ප්‍රශ්න නොමැති අතර, සංවර්ධනය හෝ වෙනත් කටයුත්තක් කරන්නේ නම් පක්ෂය අදාල කර නොගෙන සියලු දෙනාට තමන් සහය ලබා දී තිබෙන බව ද සභාපති තනතුරේ සිටීම හෝ නොසිටීම සංවර්ධනය කිරීමේ දී ප්‍රශ්නයක් විය යුතු නැති බව ද පැවසූ ගරු සභාපතිතුමා නගරයේ සංවර්ධනය සඳහා ලැබුණු ව්‍යාපෘති තුනක් නතර කර ඇති බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් අවුරුදු කීපයක් තිස්සේ ගරු ආණ්ඩුකාරවරු කිහිප දෙනෙක් සිටි අතර, සභාවේ කිසිදු ගැටලුවක් ඇති නොවූ බව ද පසුව ගරු ආණ්ඩුකාරවරු පවා පුද්ගලික

අමනාපකම් සභාවත් සමග ඇති කර ගැනීමට හේතු වූයේ සභාවේ ගරු මන්ත්‍රී කණ්ඩායම නිසාවෙන් බව ද එබැවින් සභාවට ලැබෙන්නට තිබුණු ප්‍රතිපාදනයන් අහිමි කර ගත්තේ ගරු මන්ත්‍රී කණ්ඩායම විසින්ම බව ද පැවසීය. එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සමග නගරයට අවශ්‍ය කරන ක්‍රීඩා පිට්ටනිය සංවර්ධනය කිරීමේ කටයුතු කරගෙන යන අතර, ඒ ආකාරයෙන් අනිකුත් සංවර්ධන කටයුතු කළ හැකි බව තමාගේ අදහස බව ද තමන්ට ද දේශපාලන පක්ෂයක් තිබෙන බැවින් එම පක්ෂයෙන් උපදෙස් ලබා දෙන බව ද ඒ අනුව රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පළාත් පාලන ආයතන සඳහා ලබා දී ඇති පනතට හානියක් වන ලෙස කටයුතු කිරීම අපගේ යුතුකමක් නොවන බව ද එහෙම වුවහොත් එය වැරදි පූර්වාදර්ශයක් වන බව තමන් සිතන බව ද පැවසීය.

පසුගිය කාලයේ තමන් මුහුණ දුන් අධිකරණ කටයුත්ත ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන ඉතිහාසයටම හොඳ නඩු තීන්දුවක් වන බව ද ගරු සභාපතිවරුන් හා නගරාධිපතිවරුන්ගේ බලයට අනවශ්‍ය ආකාරයෙන් හානියන් කර, එම බලය අයිතියක් නැති පාර්ශවයක් වෙත උදුරා ගැනීමට එරෙහි හොඳ නිදර්ශනයක් වන බව ද සියලුම දෙනා එම නඩු තීන්දුව කියවා බැලුවහොත් එය කොතරම් සාධාරණ ද යන්න වැටහෙන බව ද එය රටේ අනාගත පළාත් පාලන ආයතන පද්ධතියටම වටින ලියවිල්ලක් වන බව ද වෙනත් නඩු තීන්දු වල දී පවා එම නඩු තීන්දුව සහ ප්‍රකාශය උදාහරණයට ගනීවි යැයි තමන් සිතන බව ද බළන්ගොඩ ජනතාව වෙනුවෙන් එකමුතුව සංවර්ධනයන් සිදු කළ යුතු බව ද එහි දී අපගේ නම හෝ තනතුර වැදගත් නොවන බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා තවදුරටත් අදහස් දක්වමින් තමන් පසුගිය මැතිවරණයේ දී මන්ත්‍රීවරයෙක් වීමට තරග කළ අවස්ථාවේ දී මැතිවරණ ප්‍රචාරක දැන්වීම්වල වංචාව, දූෂණය හා පවුල් පාලනයට තිත යනුවෙන් සඳහන් කළ බව ද ඒ ආකාරයෙන්ම හෘද සාක්ෂියට එකගව තම පවුලේ කිසිදු අයෙක් හෝ ඥාති හිත මිත්‍රාදීන් සභාවේ කිසිම දෙයකට සම්බන්ධ කර නොගත් අතර, සභාවේ පරිපාලනය සඳහා කිසිම බලපෑමක් ඔවුන්ගෙන් සිදු නොවූ බව ද සභාවේ රථ වාහන සභාවේ රියදුරන් විසින් භාවිත කරන අතර, තමන්ට හිමි ගමන් වියදමක් පවා නොගත් බව ද පැවසීය. එමෙන්ම සභාව පෙර තිබූ තත්ත්වයට වඩා වෙනස් ආකාරයකට වෙනස් කිරීමට යම් ප්‍රමාණයකින් හෝ හැකි වීම සම්බන්ධව තමන් සතුටු වන බව ද ඉදිරියේ දී පැමිණෙන සියලුම දේ වෙනුවෙන් අප හැමදෙනාම සාර්ථකව මුහුණ දී අමනාපකම්වලින් තොරව එකමුතුව සංවර්ධනය සිදු කරමුයි ඉල්ලා සිටින බව ද පවසමින් අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු උප සභාපතිතුමා මන්ත්‍රී මණ්ඩලය ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පලකරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.3.40ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.